


CED Sri Lanka

Quality Education For All

අධ්‍යාපන සංවර්ධන සංධානය

ත්‍රෛමාසික අධ්‍යාපනික පුවත් සඟරාව  පළමුවන කලාපය 2016 ජුනි

# අධ්‍යාපන සංවර්ධන සංධානය ශ්‍රී ලංකාවේ ප්‍රථම සිවිල් සංවිධාන අධ්‍යාපන සම්මන්ත්‍රණය පවත්වනු ලබයි

අධ්‍යාපන සංවර්ධන සංධානය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම සිවිල් සංවිධාන අධ්‍යාපන සම්මන්ත්‍රණය 2015 දෙසැම්බර් 28, 29 දින වල බත්තරමුල්ලේ පිහිටි නාගරික සංවර්ධන අධිකාරයේ ශ්‍රවණාගාරයේදී පවත්වනු ලැබීය. 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ දැක්වෙන අධ්‍යාපන අරමුණු ලඟාකරගැනීම සඳහා අදාළ පාර්ශවයන්ගේ උනන්දුව සහ සම්බන්ධීකරණය ප්‍රවර්ධනය කිරීම උදෙසා පැවැත්වූ මෙම සමුළුවේ මූලික තේමාව වූයේ “තිරසාර අධ්‍යාපනයයි”.

දිවයිනේ විවිධ ප්‍රදේශ නියෝජනය කරන්නාවූ විද්වතුන්, අධ්‍යාපනඥයින්, කළාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්, විදුහල්පතිවරුන්, රජයේ අධ්‍යාපන බලධාරීන්, විශ්ව විද්‍යාල සිසුන්, ලේඛකයින් ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගී වූහ. මෙහි සමුළුව විවෘත කිරීම සඳහා ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගී වූයේ ජාතික සහජීවනය සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍ය මනෝ ගනේෂන් මහතාය.



ජාතික සහජීවනය සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍ය මනෝ ගනේෂන් මහතා.

අමාත්‍යවරයා මෙහිදී අදහස් දක්වමින් වර්තමාන රජය. රට දියුණු කිරීමේ කාර්යයේදී සිවිල් සමාජයේ සහාය වැඩි වැඩියෙන් අපේක්ෂා කරන බව පැවැසීය. එසේම ජාතික සහජීවනය ආරම්භ වන්නේ ළමුන්ගේ පෙළ පොත් තුළින් බවත් ඒවායේ අඩංගුවන ජාතික සමගියට බාධාවක් වන කරුණු ඉවත් කිරීමට කටයුතු කරන බවත් සඳහන් කළේය. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ උපදේශ අනුව මේ සඳහා විශේෂ කැබිනට් අනු කමිටුවක්ද පත් කරන බව ඔහු පැවසීය.

UNICEF ආයතනයේ උපදේශකවරයකු වශයෙන් කටයුතු කළ ආචාර්ය එස් බී ඒකනායක මහතා “සංශෝධන ප්‍රතිපත්ති සහ තිරසාර සංවර්ධනය” යන තේමාව යටතේ මෙහි ප්‍රධාන දේශනය පැවැත්වූයේය. මූලික සහ වැඩිහිටි අධ්‍යාපනය සඳහා වූ ආසියා දකුණු හා පැසිෆික් කළාපීය සම්මේලනයෙහි ධාරිතා සංවර්ධන උපදේශිකා සුස්මිතා චවුද්‍රි මහත්මිය මෙම අවස්ථාවට විශේෂ නියෝජිතවරිය වශයෙන් සහභාගී වුවාය.

අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීමේ අවස්ථා, සාධාරණත්වය, සියලු දෙනා අන්තර්ග්‍රහණය වීම සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ සමානවත්වය, ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනය, අධ්‍යාපනය සම්බන්ධයෙන් වගවීම, යනාදී තේමාවන් යටතේ පර්යේෂකයින් 17 දෙනෙකු විසින් තම පර්යේෂණ අධ්‍යයන ඇසුරින් අණාවරණය කරගත් කරුණු මෙහිදී විද්වත් කමිටු වෙත ඉදිරිපත් කරන ලදී. මෙහිදී සිදුකරනු ලැබු අදහස් දැක්වීම් සහ සාකච්ඡාවන් මගින් 2030 අධ්‍යාපන අරමුණු දිනාගැනීම සඳහා රජයට බලපෑමක් ඇතිකිරීම සඳහා සාමූහික වැඩසැලැස්මක් සකසා ගැනීමට සිවිල් සංවිධාන සහ මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශවයන් තුළ එකඟතාවයන් ඇතිකිරීමට දෙදිනක් පුරා පැවැති මෙම සමුළුව මගපාදනු ලැබිණි.

# නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමටයි

අධ්‍යාපනය වෙනුවෙන් දැනටමත් අප සතුව පවත්නා පාසල්, විද්‍යාගාර, වෙනත් උපකරණ හා ගුරුවරුන් යනාදී මානව හා භෞතික සම්පත් ප්‍රමාණවත්ව පවතින නමුත් අපගේ අධ්‍යාපනයේ ගුණාත්මක භාවය සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේ දැඩි අවශ්‍යතාවයක් පවතින බව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා පැවසීය. දේශිය හා විදේශීය වශයෙන් පැනනැගෙන්නාවූ වර්තමාන සහ අනාගත අවශ්‍යතාවන්ට අනුව දැනුමෙන් හා කුශලතාවන්ගෙන් පරිපූර්ණ ශිෂ්‍ය සම්පන්න පුද්ගලයෙකු බිහිකිරීමට මෙම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුලින් හැකිවනු ඇතැයිද ජයතිලක මහතා අප සමග පැවැත්වූ සාකච්ඡාවකදී සඳහන් කළේය. සමාජයේ විවිධ පාර්ශවයන් සමඟින් සිදුකරන ලද සාකච්ඡා අදහස් දැක්වීම හා නොයෙක් වර පවත්වන ලද විධිමත් අධ්‍යයන හා ප්‍රායෝගික අත්දැකීම් පදනම් කරගෙන දිගුකාලීන දැක්මක් සහිතව. මෙම නව ප්‍රතිසංස්කරණ යෝජනා සකස්කර තිබෙන බව ඔහු සඳහන් කළේය. අධ්‍යාපනය යනු පුරවැසියන්ගේ අයිතියක් බවත් මෙම මතය ජනසමාජය තුළ ප්‍රචලිත කිරීම සඳහා අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයක් මෙම නව ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වාදීමට කටයුතු කරනු ඇති බවත් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම අවස්ථාවේ ලබාදීමට නොහැකි වුවත් මෙම යෝජනා ජුනි මස අගභාගයේදී රජයට ඉදිරිපත් කිරීමට නියමිත බව මහාචාර්ය ජයතිලක වැඩිදුරටත් සඳහන් කළේය.

# 2030 තිරසාර සංවර්ධන අරමුණ දිනාගැනීමට සිවිල් සමාජීය සහයෝගය ලබාගැනීම තහවුරු කරමින් අධ්‍යාපන සංවර්ධන සංධානයේ 2016 -2018 නව වැඩසටහන් සැලැස්ම එළිදකී

**අපේ දැක්ම**

ජාති, ආගම්, කුල, භාෂා, සමාජ සහ ආබාධිත තත්වයන් නොසලකා සියලු දෙනාටම ගුණාත්මක හා සමාන අධ්‍යාපන අවස්ථාවන් සහතික කිරීම.

**අපේ මෙහෙවර**

සියලු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සකස් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බිම් මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සිවිල් සමාජ සංවිධාන හා පුරවැසියන් මැදිහත්වීම පිණිස බලපෑම් කිරීම හා දිරිගැන්වීම ද අධ්‍යාපනික සංවර්ධනය උසස්ම ප්‍රමිතීන්ගෙන් යුතුව ලබා ගැනීමට සිවිල් සංවිධාන හා පුද්ගලයන් දිරිමත් කිරීම

වසර 2030 දී සැමට යාවජීව අධ්‍යාපන අවස්ථා ප්‍රවර්ධනය කරමින් සියළුදෙනා අන්තර්ගතවූ සහ සම අවස්ථා සහිත ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කිරීම නම් වූ මෙම ගෝලීය අරමුණ සාක්ෂාත් කර ගැනීමට සිවිල් සමාජීය දායකත්වය සක්‍රීයව ලබාදීම, අධ්‍යාපන සංවර්ධන සංධානයේ මෙම නව වැඩසැලැස්මේ මූලික පදනම වශයෙන් යොදාගෙන තිබේ.

අධ්‍යාපන සංවර්ධන සංධානයේ නව වැඩසටහන් සැලැස්ම සැකසීම සාමාජික සංවිධාන, අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයින් හා කාර්යය මණ්ඩලයේ සහභාගිත්වයෙන් සිදුවිණි. නව වැඩසටහන් සැලසුම් යෝජනාව අධ්‍යාපනය සඳහා වූ සිවිල් සංවිධාන එකමුතුවේ අනුමැතිය සඳහා යොමුකරන ලද අතර වරින් වර සිදුකරන ලද සංශෝධන වලින් අනතුරුව මේ වන විට එයට මූලික වශයෙන් අනුමැතිය හිමිවී ඇත. මෙම වැඩසටහන් සැලැස්ම ප්‍රධාන අරමුණු 3 ක් පාදක කොටගෙන සැකසී ඇති අතර ඒවා ඉතා සරල හා සාරාංශගතව පහතින් දැක්වේ.

1. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියට සිවිල් සංවිධාන නායකත්වය ලබාදීම සහ අධ්‍යාපන සංවර්ධන සංධානයේ මැදිගත්වීම ගුණාත්මක සහ ඵලදායී ආකාරයෙන් ඉහළ නැංවීම
2. අධ්‍යාපන සංවර්ධන ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය, සමානත්වය, සියලුදෙනා අන්තර්ගතවීම සහ වගවීම තහවුරු කිරීම සඳහා ප්‍රජාවේ සහභාගිත්වය ඉහළ නැංවීම
3. ශ්‍රී ලංකාවේ ජාතික සහ පළාත් මට්ටමේ අධ්‍යාපන වැඩසැලැසුම් තිරසාර සංවර්ධන අරමුණු 4ට අයත් න්‍යායයපත්‍රයන්ට අනුකූල බවට තහවුරු කිරීම



මෙම ප්‍රධාන අරමුණු කරා ලඟාවීම සඳහා, රාජ්‍ය රාජ්‍ය නොවන හා විවිධවූ ප්‍රජා කණ්ඩායම් සමගින් විවිධවූ ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර තිබේ. වසර 3 ක් පුරා දිවෙන සමස්ත වැඩසටහන යටතේ සිදුකිරීමට නියමිත ක්‍රියාකාරකම් අතුරින් 2016 වසරේ සිදුකරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව සාමාජිකත්වය හා ප්‍රජාව දැනුම්වත් කිරීම මෙම ලිපියේ අරමුණ වේ.

අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියෙහි සිවිල් සංවිධාන වල මැදිහත්වීමේ බලපෑම වැඩි කිරීම සඳහා පළමුවන ක්‍රියාකාරකම වශයෙන් අධ්‍යාපන සංවර්ධන සංධානයේ සාමාජිකත්වය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක වශයෙන් වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. ඒ සඳහා 2016 වසර නිමා වන විට දැනට සිටින සාමාජික සංවිධාන සංඛ්‍යාව 60 සිට 125 දක්වා ඉහළ නංවාලීමට අපේක්ෂිතය. මේ අනුව එක් දිස්ත්‍රියකින් සංවිධාන 5 ක් වශයෙන් දිස්ත්‍රික්ක 25 න් සාමාජික සංවිධාන 125 ක් බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ. මෙහිදී දිස්ත්‍රික්ක අනුව දැනට සාමාජිකත්වය ලබාගෙන තිබෙන සංවිධාන ප්‍රමාණය ලැයිස්තුගත කර අඩුවෙන් නියෝජනය වී ඇති ප්‍රදේශ වලින් නව සාමාජික සංවිධාන බඳවා ගැනීමට ක්‍රියාකරනු ඇත. තම දිස්ත්‍රික් නියෝජනය කිරීම සඳහා සුදුසු සංවිධාන ඇත්නම් නම් කර එවන මෙන් දැනටමත් දිස්ත්‍රික්ක සම්බන්ධීකාරකවරුන් දැනුම්වත් කර ඇත.

අධ්‍යාපන සංවර්ධන සංධානයේ මැදිහත්වීම් වල බලපෑම ඉහළ නැංවීම සඳහා සංවිධාන වලට අමතරව අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ වල නියැලුනු, වැඩසටහන් ක්‍රියාත්මක කළ පළපුරුදු විද්වතුන්ද සංධානය හා සම්බන්ධ කරගැනීමට සැලසුම් කර තිබේ. ඉදිරියේදී බඳවා ගැනීම සඳහා නම්කරන සංවිධාන තෝරාගැනීමේදී ඔවුන් සතුව පැවැතිය යුතු අවම සුදුසුකම් මේ වන විට නිශ්චය කර තිබෙන අතර වඩාත් ගුණාත්මක භාවයෙන් ඉහළ සාමාජික සංවිධාන පමණක් සාමාජිකත්වය ලබා ගැනීම මෙමගින් තහවුරු වනු ඇත.

අධ්‍යාපන සංවර්ධන සංධානයේ සාමාජිකයින් සහ අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනද සමගින් අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ තිරසාර සංවර්ධන ඉලක්කයන් ලඟාකර ගැනීම සඳහාවූ විශේෂිත ක්‍රියාමාර්ග රැසක්ද මෙම වැඩසැලැස්මට ඇතුළත්වේ.

මෙම දීර්ඝකාලීන පොදු ඉලක්කයන් කරා යාමේදී විවිධවූ පාර්ශවකරුවන්ගේ මැදිහත්වීම, සම්බන්ධීකරණය හා එකගතාවය වැදගත් වන බැවින් මෙයට අදාළ ක්‍රියාකාරකම් ජාතික න්‍යායය පත්‍රයට අනුකූලව සිදුකිරීමට අපේක්ෂා කෙරේ. තිරසාර අධ්‍යාපන අරමුණු හා ඉලක්කයන් පිළිබඳව සාමාජික සංවිධාන දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබේ. මෙම වැඩසටහන් මෙම වසරේ ඉදිරි මාසයන් හිදී පැවැත්වෙනු ඇත.

ශ්‍රී ලංකාවට වඩාත් උචිතවූ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීමට තවමත් අපි අපොහොසත්වී ඇත්තෙමු. පළාත් වශයෙන් පවත්නා විවිධවූ සමාජ ආර්ථික සාධක පිළිබඳව සැලකිල්ලට ගනිමින් ජාතික වශයෙන් වූ අභිලාශයන් මුදුන්පත් කරගැනීම සඳහා වූ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක දැඩි අවශ්‍යතාවයක් තිබේ. ඵලදායී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීමේදී සැලකිල්ලට යොමු කළයුතු අංශ හඳුනාගැනීම සඳහාත්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් නියාමක අධ්‍යයනයක් සිදුකිරීමට සැලසුම් කර තිබේ.

අධ්‍යාපනය සම්බන්ධයෙන් පවත්නාවූ විවිධාකාරයේ වූ ගැටලු සම්බන්ධයෙන් පොදු ජනතාව මැදිහත්වන අවස්ථාවන් අපට දකින්නට හා අසන්නට ලැබේ. කෙසේවෙතත් සමාජයේ බලපෑම් වලට ලක්වූ ආන්තීකරණයට මැදිවූ කණ්ඩායම් වලට බලපාන්නාවූ විශේෂ ගැටලු පිළිබඳව අවධානයට යොමුවන අවස්ථාවන් සාපේක්ෂ වශයෙන් විරලය. මෙවැනි කණ්ඩායම් විශේෂයෙන්ම ආන්තීකරණයට ලක්වූ කාන්තාවන්ට හා තරුණයින්ට බලපාන්නාවූ ගැටලු හඳුනාගැනීමටත් ඒවා වාර්තා කිරීමටත් හැකිවන පරිදි එම ප්‍රජාවන් නියෝජනය කරන පුද්ගලයින් සවිබල ගැන්වීම සඳහා පුහුණුවක් ලබාදීමට මෙවර වැඩසැලසුමෙන් ඉඩප්‍රස්ථාව සලසා ඇත. ආන්තීකරණයට ලක්වූ කාන්තාවන්ට සහ තරුණ කණ්ඩායම් වලට අධ්‍යාපනය සම්බන්ධයෙන් බලපැම් කරන්නාවූ ගැටලු වාර්තා කිරීම සඳහා පුහුණුව ලබාදෙන ලද පුහුණුලාභීන් විසින් සපයන ලබන වාර්තා වලට අධ්‍යාපන සංවර්ධන සංධානය මගින් ප්‍රකාශයට පත් කරනු ලබන “හඬ -Voice” සඟරාවේ විශේෂ ස්ථානයක් ලබාදීමට අපේක්ෂා කෙරේ. අධ්‍යාපන සංවර්ධන සංධානය මගින් සිදුකරනු ලබන මැදිහත්වීම්, වැඩසටහන් මෙන්ම සාමාජික සංවිධාන විසින් සිදුකරනු ලබන වැඩසටහන් හා අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ වෙනත් වැදගත් කරුණු ද මෙම සඟරාව මගින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා ලිපි එවන මෙන් අපි ඔබට ආරාධනය කර සිටින්නෙමු.

තිරසාර අධ්‍යාපන අරමුණු සහ විශේෂයෙන්ම අධ්‍යාපනය සම්බන්ධ තීරණ හා ප්‍රතිපත්ති සැකසීමේදී තමන්ට සිදුකළ හැකි මැදිහත්වීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් දැනුම්වත්භාවයක් පොදු ජනතාවට නොමැත. මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරමින් තිරසාර සංවර්ධන අරමුණු හා විශේෂයෙන්ම අධ්‍යාපන ඉලක්කයන් සම්බන්ධයෙන් පළාත් මට්ටමේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමට සැලසුම් කර තිබේ. මෙය අදියර දෙකකින් සිදු කිරීමට නියමිත අතර පළමු අදියරේදී නැගෙනහිර, උතුරුමැද, දකුණ, සබරගමුව සහ බස්නාහිර පළාත්වලට දෙවන වටයේදී සෙසු පළාත් වල පැවැත්වීමට නියමිතය.

අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය වැනි කඩඉම් ජයගැනීමට නොහැකිවීම හැරුණු කොට මෙම සාමාන්‍ය පාසල් අධ්‍යාපන ක්‍රියාවලිය අතරතුර දී සිසුන්ගෙන් සැලකිය යුතු පිරිසක් පාසල හැරදමා යති. පාසල් අධ්‍යාපනයෙන් ගිලිහුනු සිසුන් නැවත පාසල් වෙත යොමුකරන ලැබුවත් ඔවුන් නැවතත් පාසල් හැරයාමේ ප්‍රවනතාවක්ද දැකිය හැකිය. මෙම තත්වයට හේතු වන්නේ කුමක්ද? පාසල හැරගොස් නැවත පාසලට පැමිණෙන ළමයා පිළිගැනීමට පාසල සහ පාසල් ප්‍රජාව සූදානම්ද? මේ සම්බන්ධයෙන් දෙමව්පියන් ගුරුවරුන් සතු වගකීම් මොනවාද යනාදිය සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදුකිරීමටත් එහි ප්‍රතිඵල මත මෙම ප්‍රශ්නයට විසඳුම් සොයාගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීමත් සම්බන්ධව කටයුතු කිරීමටද අධ්‍යාපන සංවර්ධන සංධානය මෙවර තම වැඩසැලැස්මේ අවධානය යොමුකර ඇත.

ළමයකු තම හැකියාවන් පූර්ණ ආකාරයෙන් යොදාගනු ලබන්නා වූ සමාජයට වැඩදායී ඵලදායී හා සාර්ථක ජීවිතයන් ගතකරන්නාවූ වැඩිහිටියකු බවට පත් කිරීම සඳහා ඔහුගේ හෝ ඇයගේ මුල් ළමාවිය සංවර්ධනය සහ රැකවරණ අතිශය බලපෑමක් එල්ල කරනු ලබයි. ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධන සහ රැකවරණ සැපයීම මූලික වශයෙන් රාජ්‍ය නොවන අංශ නියෝජනය කරන්නා වූ ආයතන සහ පෞද්ගලික ආයතන මගින් පවත්වාගෙන යනු ලබන පෙර පාසල්/දිවාසුරැකුම් මධ්‍යස්ථාන වැනි ආයතන මගින් සිදුවේ. මෙම තත්වය මත අදාළ ආයතන සම්බන්ධයෙන් යම් ප්‍රමිතියක් පවත්වා ගැනීමට නිර්නායකයන් සැපයීමට ද බාධාවක් ඇතිවී තිබේ. මුල් ළමාවිය සංවර්ධන සහ රැකවරණ සේවාවන් වල ගුණාත්මකභාවය සහ මේ සම්බන්ධයෙන් පවත්නා පහසුකම් මැනබැලීම සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදුකිරීමටද මෙවර වැඩසැලැස්මෙහි යෝජනා වී ඇති අතර මෙය ළමා සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය සමග සාකච්ඡා කර ඔවුන්ගේ සහභාගිත්වය සහිතව සිදුකිරීමට අපේක්ෂිතය.

> **ළමයකු තම හැකියාවන් පූර්ණ ආකාරයෙන් යොදාගනු ලබන්නා වූ සමාජයට වැඩදායී ඵලදායී හා සාර්ථක ජීවිතයන් ගතකරන්නාවූ වැඩිහිටියකු බවට පත් කිරීම සඳහා ඔහුගේ ඇයගේ පූර්ව ළමාවිය සංවර්ධනය සහ රැකවරණ අතිශය බලපෑමක් එල්ල කරනු ලබයි.**

අධ්‍යාපනය සම්බන්ධයෙන් වඩාත්ම ප්‍රශස්ථ තීරණ වලට එලැඹීමේ දී අදාළ කරුණු සම්බන්ධයෙන් මහජන කතිකාවත් පැවැතීම ඉතා වැදගත්වේ. ඵලදායී අධ්‍යාපනික ප්‍රතිපත්තිමය කරුණු වැනි විෂයයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ මාධ්‍යයන්හි අවධානය යොමුවන්නේ කලාතුරකිනි. මෙම තත්වයට විසඳුම් සෙවීම සඳහා අධ්‍යාපනය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් පුවත් හා ලිපි පළකිරීමට හා මේ කරුණු මාධ්‍ය ඔස්සේ විචාරයට ලක්කිරීමට මාධ්‍යවේදීන් උනන්දු කිරීම සඳහා ක්‍රමෝපායයක් වශයෙන් ඔවුන් සඳහා වූ දැනුම්වත් කිරීමේ සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන් ද තිරසාර සංවර්ධන අරමුණු ලගාකරගැනීම සඳහා දියත් කරනු ලබන ජාතික ක්‍රමෝපායන් හා සුසංගතව සිදුකිරීමට අපේක්ෂිතය.

ජාතික සහ අන්තර්ජාතික වශයෙන් වැදගත්වන්නා වූ අධ්‍යාපනයට හා සම්බන්ධ විශේෂ දින එනම් අන්තර්ජාතික ළමා දිනය, ගුරු දිනය, සාක්ෂරතා දිනය වැනි දිනයන් සාමාජික සංවිධාන හා එක්ව ප්‍රාදේශීය වශයෙන් සැමරීමට කටයුතු යොදා ඇත. මෙයට සමගාමීව ප්‍රධාන දහරාවේ මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ඔස්සේ ද මේ සම්බන්ධ දැනුම්වත් කිරීම් සිදුකරනු ඇත

අධ්‍යාපනය සම්බන්ධයෙන් මැදිහත්වීම සඳහා පිහිටුවනු ලබන පළාත් අධ්‍යාපන කමිටු වලට මෙවර වැඩසටහන් සැලැස්මේ විශේෂ වැදගත්කමක් හිමිවේ. රජයේ අධ්‍යාපන බලධාරීන් සහ අධ්‍යාපනය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පුද්ගලයින් සහ ප්‍රදේශයේ සිවිල් සංවිධාන වල නියෝජිතයින්ගෙන් සමන්විත කමිටු නවයක් සියලුම පළාත් තුළ පිහිටුවීමට කටයුතු කරනු ඇත. පියවර කිහිපයක් ඔස්සේ ගොඩනංවනු ලබන මෙම කමිටු සංවිධානය කරනු ලබන්නේ අධ්‍යාපන සංවර්ධන සංධානයේ පළාත් සම්බන්ධිකාරක විසිනි. ඉදිරි අනාගතයේ සිදුකරන්නාවූ සාකච්ඡාවන් සහ වැඩසටහන් හා උද්දේශන ක්‍රියාකාරකම් සඳහා බලධාරීන්ගේ අවධානය යොමු කරගැනීමේ සහ අධ්‍යාපනය සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී ජනතාවට යම් ඉඩ ප්‍රස්ථාවක් පවතින බවත් එමගින් තම ප්‍රදේශයේ අවශ්‍යතාවන්ට හිතැති අධ්‍යාපනික පරිසරයක් හා සම්පත් උපයෝගීතාවයක් ඇතිකර ගැනීමට මෙමගින් අවස්ථාව උදාවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# අධ්‍යාපනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ලබා ඇති ප්‍රගතීන් සහ අනාගත අභියෝග

දකුණු ආසියාතික කළාපීය රටවල් අතුරින් අධ්‍යාපනය සම්බන්ධ දර්ශකයන්හි ඉහළ මට්ටමේ අගයයන් වාර්තා කිරීමට ශ්‍රී ලංකාව සමත්වී ඇත. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ප්‍රවේශවීමට සියලුම ආර්ථික සමාජ තත්වයන් නියෝජනය කරනු ලබන කණ්ඩායම් වලට සාධාරණ අවස්ථාවන් පැවැතීම, ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව සමාන තත්වයෙන් අධ්‍යාපන අවස්ථාවන් ලබාගැනීමට යොමුවීම හා පොදුවේ ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ප්‍රවේශවන අනුපාතිකය ඉහළ මට්ටමක පැවැතීම සහ ඉහළ සාක්ෂරතා මට්ටමක් පැවැතීම යනාදිය මේ මගින් මෙම තත්වයන් මනාව පිළිබිඹු වේ.

අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ අන්තර්ජාතික මට්ටමේ ප්‍රඥප්තීන් වන “සැමටම අධ්‍යාපනය, සහශ්‍ර සංවර්ධන අරමුණු” යනාදියෙහි දැක්වුනු ඉලක්ක සාර්ථකව ලඟාකර ගැනීමට ශ්‍රී ලංකාව සමත්විය. ශ්‍රී ලංකාවේ සාමාන්‍යයෙන් ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇතුළත් වන ප්‍රමාණය 98%ක් වන අතර මේ අතරින් ප්‍රාථමික අධ්‍යාපනය හමාර කරන සංඛ්‍යාව 95% ඉක්මවයි. ප්‍රාථමික අධ්‍යාපන මට්ටමේදී ගැහැණු පිරිමි අනුපාතිකය සමාන අගයක් ගන්නා අතර මෙම තත්වයේ යම් වෙනස්වීමක් ද්විතීයික අධ්‍යාපන මට්ටමේදී දැකගත හැකිය. උසස් අධ්‍යාපනය එනම් විශේෂයෙන්ම විශ්ව විද්‍යාල මට්ටමේදී පිරිමින්ට වඩා වැඩියෙන් කාන්තාවන් අධ්‍යාපනයට යොමුවීම මෑතකාලීනව දක්නට ලැබුණ නමුත් වෙනත් ආසියාතික රටවල් හා සසඳා බැලීමේදී මෙම වෙනස සාපේක්ෂ වශයෙන් අවම මට්ටම පවති. **කෙසේවෙතත් ජාතික මට්ටමින් විද්‍යමාන වන මෙම ඉහළ මට්ටමේ ධනාත්මක අගයයන් මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක භාවය සම්බන්ධයෙන් දැඩි අවධානය යොමුකළ යුතු අතිශය වැදගත් කරුණු සමුදායක් යටපත් වීමට තුඩුදෙන බව පැවසීය යුතුවේ.**

යටත් විජිත ක්‍රමයේ දායාදයක් ලෙසින් ශ්‍රී ලංකාවට හිමිවූ විධිමත් අධ්‍යාපන ක්‍රමයේ උන්නතිය සඳහා බලයේ සිටි රජයයන් විසින් විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේ. සියලුම දෙනාට නොමිළයේ රජය මගින් අධ්‍යාපනය ලබාදීමට 1945 දී රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත්ම පියවරක් ලෙස හැඳින්විය හැකිය. ඉන් පසුවද අධ්‍යාපන ක්‍රමය සහ එයට අදාළ ව්‍යුහාත්මක හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම අඛණ්ඩව සිදුකරන ලදී. අධ්‍යාපනයට යොමුවීම දිරිගැන්වීම උදෙසා රජය විසින් නොමිළයේ ආහාර ලබාදීම, නොමිළයේ නිල ඇඳුම් සහ පෙළ පොත් ලබාදීම ආදී විවිධ උපායය මාර්ග යන් අනුගමනය කරණ ලදී. වර්තමානයේ අප ලබාගෙන ඇති සිත්ගන්නාවූ ප්‍රගතිය මෙම ක්‍රියාමාර්ග වල යහපත් ප්‍රතිඵල බව ඉතා පැහැදිලිය.

කෙසේවෙතත් අතීතයේ ගන්නා ලද ක්‍රියාමාර්ග හා වර්තමානයේ අප ලබාගෙන ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් උදම් ඇනිය හැකි නමුත් අනාගතයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් අභියෝග ගණනාවකට මුහුණ දීමට සිදුවන බවට වූ පෙරමග ලකුණු පහළ වී ඇති අතර මේවායින් සමහරකට අප දැනටමත් මුහුණදී සිටින්නෙමු. උදාහරණ වශයෙන් විශේෂයෙන්ම උගත් තරුණ තරුණියන් අතර පවත්නා රැකියා විරහිත තත්වය සැලකිය හැකිය. අපගේ අධ්‍යාපන ක්‍රමය මූලික වශයෙන් වෙළඳපොළ අවශ්‍යතාවන් පිළිබඳ සංවේදී හා රැකියාවක් ලබාගැනීමේ දිශානතීන්ට යොමුවූවක් නොවන නිසා ද්විතීයික හා උසස් අධ්‍යාපනය කරා යොමුවූ පිරිස් රැකියා විරහිතයින් ලෙස සමාජයට එක්වීමත් ඔවුන් විසින් සපුරාලනු ලැබූ සුදුසුකම් සඳහා රැකියා අවස්ථා නොමැතිවීමත් තුළ ඔවුන් නොයෙකුත් අරගලකාරී ක්‍රියාමාර්ග වලට එළැඹීමේ අවස්ථා බහුලව නිරීක්ෂණය කළ හැකිය. විවෘත ආර්ථිකය සහ ගෝලීයකරණයේ බලපෑම මත සිග්‍රයෙන් වෙනස් වන්නාවූ ලෝකයේ වර්තමාන ආර්ථික ක්‍රියාකරකම් සඳහා අවශ්‍ය නිපුණත්වයන් සහ ප්‍රවීනත්වයන් අතිශයින් සංකීරණ වී ඇත.

> ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන අතර මේ සම්බන්ධයෙන් ගනු ලබන්නාවූ ප්‍රතිපත්තිමය තීරණ හුදෙක් දේශපාලනික අවශ්‍යතාමත සිදුකරන්නාවූ හදිසියේ ගනු ලබන ඒවා බව නිරීක්ෂණය කළ හැකිය.

පසුගිය දශකයන් හි ආර්ථික දත්ත පිළිබඳව අවධානය යොමු කරන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකය තවදුරටත් කෘෂිකර්මය මත රඳානොපවතින බව පැහැදිලිවේ. සාම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රමයේ සිට වාණිජ සේවා අංශයටද ඉන් පසුව කර්මාන්ත නිෂ්පාදන හා තාක්ෂණික අංශයන් වෙතට ද ආර්ථිකය පරිනාමනය වී ඇත. සාම්ප්‍රදායික අපනයනයන් අභිබවා අනෙකුත් අංශයන් ඉදිරියට පැමිණ ඇති අතර අනාගත ලෝකයේ ඉල්ලුමත් පවතින්නේ මෙම අංශයන්ට බැවින් මෙම ක්ෂේත්‍රයන්හි ධාරිතාවය තවදුරටත් වර්ධනය කරගනීමේ අවශ්‍යතාවයක් පවතී. පවත්නා අධ්‍යාපන ක්‍රමය තුළින් ගොඩනංවනු ලබන ශ්‍රමිකයින්ගේ කුශලතා හා ප්‍රවීනත්වයන් හා අද ලෝකයේ වෙළඳ පොළ ඉල්ලුම් කරන්නාවූ ශ්‍රම බලකාය අතර පැහැදිලි වෙනස්කමක් සහ පරතරයක් දක්නට ලැබේ. මෙම තත්වය සමස්ථයක් වශයෙන් ආර්ථික වර්ධනයට හා ඒ හා බැඳුනු සංවර්ධන ක්‍රියාවලියට බාධාවක් වන අතර ලෝක වෙළඳ පොලේ ඇතිවන්නාවූ තරඟකාරිතත්වයට මුහුණදීම සඳහා ඉදිරි දැක්මින් යුත් නවෝත්පාදනයන් බිහිකිරීමේ ශක්‍යතාවයන් හා නිපුණතාවන් ගෙන් සමන්විත වන ආකාරයට අපගේ ශ්‍රම බලකාය සංවර්ධනය කිරීම සඳහා දැඩි අවශ්‍යතාවක් පවතී.

ශ්‍රී ලංකාවේ ආර්ථිකයද සමස්ථ ලෝක රටාව හා අනුගත වෙමින් කෘෂිකර්මය හා සේවා පදනම් කරගත් ආර්ථිකයක සිට කර්මාන්ත හා තොරතුරු තාක්ෂණය පදනම් කරගත් නව ආර්ථිකයක් කරා පරිනාමනය වෙමින් පවතී, අනාගත අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට මෙම ක්ෂේත්‍රයන්හි නව දැනුමෙන් අපගේ ශ්‍රම බලකාය සන්නද්ධ කිරීමේ වගකීම අධ්‍යාපන අංශය සතුවේ. සංවර්ධනය වෙමින් පවත්නා අනෙකත් රටවල් සමග සන්සන්දනය කරන විට අධ්‍යාපනය සඳහා රජය විසින් සිදුකරන ආයෝජන සහ ජනතාව විසින් දරන්නාවූ පිරිවැය ඉහළ මට්ටමක පැවැතියත් ශ්‍රී ලංකාව අපේක්ෂාකරන පරිදි අනාගතයේ “දැනුම කේන්ද්‍රකොටගත් ඉහල මධ්‍යම ආදයම් ලබන රටක් බවට පත්වීමට” අධ්‍යාපනයේ ප්‍රතිපත්තිමය වෙනස් කම් සිදුකිරීමට අවධානය යොමු කිරීමේ දැඩි අවශ්‍යතාවක් පවතී.

මෙම තත්වයට ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලංකාව අභ්‍යන්තරයේ සහ ජාත්‍යන්තර වශයෙන් පවත්නා ශ්‍රම වෙළඳපොළ අවශ්‍යතාවන්ට සංවේදී හා අනුකූල අදාළ කුශලතාවයන්ගෙන් හෙබි ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා යම් පියවර ගෙන තිබෙන නමුත් ඒවා පැහැදිලි අනාගත දැක්මකින් යුතුව පවත්නා සන්ධර්භය පිළිබඳ ප්‍රමාණවත් ලෙස කරණු අධ්‍යයනය කර විද්‍යාත්මක හා තාර්කික පදනමකින් යුතුව සිදුවී ඇති බවක් නොපෙනේ. උදාහරණ වශයෙන් වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවත්නා තත්වය ගත හැකිය. අපගේ වෘත්තීය අධ්‍යාපනය කරා යොමුවන්නන්ගෙන් බහුතරයක් සාමාන්‍ය විධිමත් අධ්‍යාපන ක්‍රමයේ කඩඉම් පරීක්ෂණ වලට මුහුණු දීමට අසමත්වූවෝ වෙති. එසේම මෙවැනි පාඨමාලා පිළිබඳව ජනසමාජයේ පවතින්නේ ධනාත්මක ආකල්පයන් නොවේ. මෙයටත් වඩා අවධානයට යොමුකළ යුතු කරුණ වන්නේ අදාළ පාඨමාලාවන් බොහොමයක් අද පවත්නා නවීන තාක්ෂණය හා උපකරණ භාවිතය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවබෝධයක් පළපුරුද්දක් ලබාදීමට අපොහොසත් අයුරින් සැකසී තිබීමයි. මෝටර් රථ තාක්ෂණවේදය හා තාක්ෂණය හා පරිගණක සම්මිශ්‍රණයවූ මෙගාට්‍රොනික්ස් වැනි තාක්ෂණික අංශ පිළිබඳව වෘත්තීයමය කුශලතාවන් ලබාගැනීමට අවස්ථාව නොපැවතීම කදිම නිදසුනකි. වෙළඳ පොළ අවශ්‍යතාවය, නිෂ්පාදන අංශ වලින් ජනිත වන නව රැකියා අවස්ථාවන් හා උසස් අධ්‍යාපන ආයතන අතර මනා සම්බන්ධතාවයක්, සම්බන්ධීකරණයක් දක්නට නොලැබේ. මෙම තත්වය තුළ වෘත්තීය පාඨමාලාවන් හැදෑරිමෙන් පසුව ද රැකියාවිරහිතයින් වශයෙන් සිටීමට සිදුවන තත්වයන් උදාවී ඇත. මෙවැනි වාතාවරණයක් පවතින බැවින් සම්මත ප්‍රමිතින්ට අනුකූල සහ ශ්‍රම වෙළඳපොලට අදාළ වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවක් ලබාදීම මගින් අදාළ නිපුණතා සහිත සහ රැකියා නියුක්තියක් සහිත සේවකයින් සැපයීම ඉහල දැමීමට අවධානය යොමුකළ යුතුව ඇත.

අනාගත ලෝකය සෞභාග්‍යමත් හා සමෘද්ධිමත් භාවයට පත්කිරීම සඳහා ආර්ථික වශයෙන් ඇතිකරගනු ලබන්නවූ ප්‍රගතීන් ප්‍රමාණවත් නොවේ. කායික හා මානසික තත්වයන්ගෙන් පරිපූර්ණ පොදුජන හිතකාමී මිනිසුන් නොසිටින්නේ නම් එසේ ලබාගන්නාවූ ආර්ථික සංවර්ධනයෙන් අපේක්ෂාකරන ප්‍රතිලාභ අපට හිමි නොවනු ඇත. ජීවිතයේ සියලුම පැතිකඩයන් මනාව සංවර්ධනයවූ සාර්ථක මිනිසකු බිහිකිරීම සඳහා පදනම දමනු ලබන්නේ මුල් ළමාවිය සංවර්ධන සහ රැකවරණ වැඩසටහන් මගිනි.

> **යටත් විජිත ක්‍රමයේ දායාදයක් ලෙසින් ශ්‍රී ලංකාවට හිමිවූ විධිමත් අධ්‍යාපන ක්‍රමයේ උන්නතිය සඳහා බලයේ රජයයන් විසින් විවිධ වූ ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේ. සියලුම දෙනාට නොමිළයේ රජය මගින් අධ්‍යාපනය ලබාදීමට 1945 දී රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැදගත්ම පියවරක් ලෙස හැදින්විය හැකිය.**

වර්තමානයේ ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය සංවර්ධනය හා බැඳුනු පෙර පාසල් මුලුමනින්ම පාහේ පෞද්ගලික හා රාජ්‍ය නොවන ක්ෂේත්‍රය යටතේ පාලනය වේ. තමන්ගේ ශක්‍යතාවයන් පරිපූර්ණ කරගත් මානව හිතවාදී වැඩිහිටියකු බිහිකිරීමේ ක්‍රියාවලියේ මුලික පදනම සැකසීමේ ක්‍රියාවලියේ දී පැවැතිය යුතු අවම ගුණාත්මක තත්වයන් පිළිබඳව මූලික ප්‍රමිතීන් සකස් කිරීමට ශ්‍රී ලංකාව තවමත් නිසි පියවරගෙන නොමැත. ඒ අනුව අදාළ ආයතත මගින් ලබාදෙන අධ්‍යාපනය කුශලතා තුලින් ළමුන්ගේ හැකියාවන් ඔප් නංවන්නේ ද අදාළ සාධන මට්ටම ලඟාකරදීමට එම ආයතන වල ධාරිතාවය ප්‍රමාණවත් ද යන්න නියාමනය කිරීමේ අවස්ථාව අපගෙන් ගිලිහී ගොස් ඇත.

තිරසාර සංවර්ධන ඉලක්කයන්හි දැක්වෙන ආකාරයට සියලු දෙනා අන්තර්ගතවූ ගුණාත්මක අධ්‍යාපන අවස්ථාවන් සැමට ලබාදීම තහවුරු කිරීමට අප විසින් තවත් බොහෝදේ කළ යුතු බව අපගේ පාසල් පද්ධතියේ පවත්නා දරුණු විෂමතා තුළින් පැහැදිලිව නිරීක්ෂණය කළ හැකිය. උදාහරණ ලෙස ප්‍රධාන විෂයයන් උගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරුන් සිටිනවාද යන කරුණ ගත හැකිය. දිවයිනේ ප්‍රධාන නගර ආශ්‍රිත වරප්‍රසාද ලත් යැයි සැලකෙන ජනප්‍රිය පාසල් වල විද්‍යා හා ගණිත ගුරුවරුන් ගේ විශාල අතිරික්තයක් පවතින නමුදු එම දිස්ත්‍රිකයේම නගරයෙන් බැහැර පාසල් වල අදාළ විෂයයන් ඉගැන්වීම සඳහා වසර ගණනාවක් පුරා ගුරුවරු නොමැතිවීමේ අවස්ථා බහුලව දැකිය හැකිය. සැමටම සමාන අධ්‍යාපන අවස්ථාවන් සම්බන්ධයෙන් ගෝලීය සංකල්පයන් ඉදිරිපත්වීමට හා අධ්‍යාපනය මානව අයිතිවාසිකමක් ලෙස නම් කිරීමටත් පෙර ශ්‍රී ලංකාවේ නිදහස් අධ්‍යපනය යටතේ මේවායේ වැදගත් කම අවබෝධ කරගෙන තිබිණි. රජය මගින් පුරවැසියන් සියලු දෙනාට නොමිළයේ රජයේ පාසල් තුළින් අඛණ්ඩ අධ්‍යානය ලබාදීමට පියවර ගැනුනේ මේ අනුවය. නමුත් පසුව සමාන අවස්ථාවන් සම්බන්ධයෙන් වූ මෙම උදාර සංකල්පය ඉවත දමා විවිධවූ අත්තනෝමතික දේශපාලන මත හා විචක්ෂණශීලී නොවූ පටු තීරණ වලට එළැඹීම මත ජාතික පාසල්, පළාත් පාසල්, නවෝද්‍යා පාසල් වැනි විවිධවූ කාණ්ඩගත කිරීමත් එකිනෙකට වෙනස්වූ වරප්‍රසාද ලත් පාසල් පද්ධතියක් නිර්මාණය වීමත් දක්නට ලැබේ. මෙම තත්වය මත නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් අතිශය තරගකාරී තත්වයක් ඇතිවීමත් නොයෙකුත් දූෂණ සහ වංචාවන් වලට මගපෑදීමත් අවශ්‍ය සුදුසුකම් පවතින නමුත් අවම වරප්‍රසාද ලත් ජනතාවට බලවත් අසාධාරණයකට ලක්වීමට සිදුවී ඇත.

පරිපාලන හා කළමනාකරණ අවශ්‍යතාවයන් උදෙසා අධ්‍යාපනය මූලික වශයෙන් මුල් ළමාවිය, ප්‍රාථමික, ද්විතීවික, තෘතීයික හා වෘත්තීයමය යනාදී අංශයනට බෙදාවෙන්කර තිබෙන නමුත් රටක ආර්ථික සමාජයීය සංස්කෘතික සංවර්ධනය උදෙසා මෙම අංශ සියල්ලම එකහා සමාන දායකත්වයක් ලබාදේ. මෙම සියලු අංශයන් එකිනෙක හා මනාව සුසංගත වීමටත් එකී අංශයන් පවත්නා සුවිශේෂීතාවයන් හඳුනාගැනීමටත් ඒ සම්බන්ධයෙන් පිළිගත් ගුණාත්මක හා සාධන මට්ටම් පවත්වා ගැනීමටත් මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුළුල් එකගතාවයකින් යුත් ප්‍රතිපත්ති හා ක්‍රමවේදයන් පැවැතීම අත්‍යාවශ්‍යවේ. මේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය, අධ්‍යාපන සේවා කොමිෂන් සභාව යනාදී ප්‍රධාන ආයතනයන් තම කාර්යයභාරයන් සහ වගකීම් මීට වඩා පුළුල්ව ගැඹුරින් අවබෝධ කරගැනීමේ දැඩි අවශ්‍යතාවයක් පවතී.

ශ්‍රී ලංකාවේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවන අතර මේ සම්බන්ධයෙන් ගනු ලබන්නාවූ ප්‍රතිපත්තිමය තීරණ හුදෙක් දේශපාලනික අවශ්‍යතාමත සිදුකරන්නාවූ හදිසියේ ගනු ලබන ඒවා බව නිරීක්ෂණය කළ හැකිය. දේශපාලනමය වශයෙන් සිදුවන

12 වන පිටුවට

# අධ්‍යාපන සංවර්ධන සංධානයේ සාමාජික සංවිධාන

| | | |
|---|---|---|
| උතුරු මැද පළාත | | |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | | |
| සාම සේවය | ජාතික ලේකම් කාර්යාලය, අනුරාධපුර පාර, තලාව | සුභද්‍රා රාජසිංහ මිය<br>දු.ක. 0253242732 |
| අපේ ශක්ති කාන්තා සංවිධානය | 74/4 ඒ, ගනන්ගොල්ල, පරාක්‍රම සමුද්‍රය, පොළොන්නරුව. | කේ.ඩබ්.ආර්. එම් යසවතී වාසල මිය<br>දු.ක. 0779681341 |
| "සහන" ආබාධිතයන් සඳහා වූ සංවිධානය | මහවැලි පෙදෙස, නොච්චියාගම | මහින්ද සිල්වා මයා<br>දු.ක. 0718490669 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | | |
| මානව හිමිකම් ප්‍රජා අධ්‍යාපන කේන්‍ද්‍රය | නො.18/3, වඩිච්චාලෙයි පාර,<br>පොළොන්නරුව. | ජී.ඩබ්.රූපතිස්ස මයා<br>දු.ක. 0272224908 |
| ශ්‍රී ලංකා ග්‍රාමීය සංවර්ධන පදනම | නැණසල මධ්‍යස්ථානය  දිවුලන්කඩවල | කේ.ජී.ඒ.එස්. වීරසිංහ මයා<br>දු.ක. 0272248563 0777975610 |
| ගැමිසරණ මහා සංගමය | සී ඩබ්. ඊ හන්දිය, හිඟුරක්ගොඩ. | ඩී.කේ.ජී.රණසිංහ මයා<br>දු.ක. 0272247129 |
| සිසිලස ලංකා ප්‍රජා සංවර්ධන සංධානය | 7-සී, නාගස් වැව, සිසිලස, දෙහිඅත්තකන්ඩිය. | ඩබ්.එස්.එස්. රණතුංග මයා<br>දු.ක. 0713394117 |
| ශ්‍රී ලංකා මානව සංවර්ධන පදනම | නො.752/40, 5 වන කනුව, හිඟුරක්දමන, හිගුරක්ගොඩ. | ඇලෙක්සැන්ඩර් පෙරේරා මයා<br>දු.ක. 0718412690 |
| ඌව පළාත | | |
| බදුල්ල දිස්ත්‍රික්කය | | |
| ග්‍රාමීය ආර්ථික සංවර්ධන පදනම | නො.168/46, රොක් හිල්ස්, බදුල්ල. | ඩබ්.ජී.ඩබ්.යු.කේ. බිබිලගේ මයා<br>දු.ක. 0552225278 0716563442 |
| අනාගතය අපේ අතේ සංවිධානය | 325/ ඒ / 3. කණුපැලැල්ල , බදුල්ල. | ප්‍රභාත් කුමාර මයා<br>දු.ක.0552230072 |
| රෙයි යු කායි ලංකා සංවිධානය | නො.168/46, රොක් හිල්, බදුල්ල. | ඩබ්.ජී.සී.එම්.කුලතුංග මයා<br>දු.ක. 0719434432 |
| ඌව ගොවි සංවර්ධන පදනම | නො.53, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත , හාලි ඇල. | එන්.නගුලේශ්වරි මිය<br>දු.ක. 0553593656 0725329275 |
| ඌව සාමය හා සමෘධිය සඳහා එකමුතුව | නො.53, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත , හාලි ඇල. | එච්.එම්.ඒ.බණ්ඩාර මයා<br>දු.ක. 0716589776 |
| මොණරාගල දිස්ත්‍රික්කය | | |
| සමාජ ආර්ථික හා පාරිසරික සංවර්ධන සංවිධානය | නො.130, මොණරාගල පාර, බඩල්කුඹුර. | ඩග්ලස් කුමාරතුංග මයා<br>දු.ක. 0552250179 0773015240 |
| දකුණු පළාත | | |
| ගාල්ල දිස්ත්‍රික්කය | | |
| "දිමුතු" ළමා හා තරුණ එකමුතුව | මනිගෙ වත්ත, ඉහල කීඹිය, ගාල්ල. | නේශාඩ් මංගලවත්ත මයා<br>දු.ක. 0774573969 |
| කාන්තා ආර්ථික සංවර්ධන පදනම | නො. 233/1, වෙරනීය වත්ත, බද්දේගම දකුණ, ගාල්ල. | මල්ලිකා ජයසිංහ ආරච්චි මිය<br>දු.ක. 0779081177 |
| මාතර දිස්ත්‍රික්කය | | |
| ප්‍රජා සංවර්ධන සංසදය | නො.85/12, මැද හිත්තැටිය, මාතර. | ඩබ්.ඩබ්. වෙල්ලාල මයා<br>දු.ක. 0418223263 |
| පහතරට ප්‍රජා මූල සංවිධාන සමූහය | නො.770, පන්සල පාර, දෙනියාය. | කේ.එස්. ලංකාතිලක මයා<br>දු.ක. 0412273371 |
| "තිස්ස ජය" ළමා සුබසාධන පදනම | කොහොන්ගමුව, වැලිගම. | ප්‍රේමබන්දු ජයතිලක මයා<br>දු.ක. 0777006483 041 2250920 |
| දිදුල පදනම | වෙහෙල් ගොඩ, දෙවිනුවර. | එච්. කේ. ගුණතිලක මයා<br>දු.ක. 0718149727 |
| නැගෙනහිර පළාත | | |
| මඩකලපුව දිස්ත්‍රික්කය | | |
| කාරුණික හදවත සංවිධානය | තැ.පෙ.01, ඔඩ්ඩමාවඩි 30420. | එස්.අයි.එම්. කබීර් මයා<br>දු.ක. 0773400732 |
| කාන්තා සංවර්ධන එකමුතුව | තැ.පෙ. 01, වාලච්චේනයි 30400. | එම්.බී.එස්. සෆීකා මිය<br>දු.ක. 077188906 |
| ලිවාහුල් හම්තු ජමාතුල් ඉස්ලාම් සභාව | මස්ජිතුල් හිල්ලූරියා, බ්‍රයිනෙතුරයිවෙනයි උතුර, වාලච්චේන - 05. | ඒ.යු.එම්.මුස්තාෆා මයා<br>දු.ක. 0766571157 |
| හිල්ලරියා කම්කරු සමිතිය | තැ.පෙ.01,  ඔට්ටමාවඩි. | එස්. අයි. හම්මාද් මයා<br>දු.ක. 0754020080 |
| අම්පාර දිස්ත්‍රික්කය | | |
| මානව ආර්ථික සංවර්ධන සංවිධානය | නො.35, එම්.පී සී එස් පාර, අඩ්ඩාලච්චේන - 02 32350. | එච්.එම්. මොහමඩ් උවයිස් මයා<br>දු.ක. 0776069111 |
| True Vision ග්‍රාමීය පුනරුත්තාපන සංවිධානය | නො.4 ඒ, මහවීදිය, අඩ්ඩාලච්චේනයි  01 | එම්.ඒ.සී මොහමඩ් උවයිස් මයා<br>දු.ක. 0672277363 0714456412 |
| බස්නාහිර පළාත | | |
| කොළඹ දිස්ත්‍රික්කය | | |

| | | |
|---|---|---|
| විශ්‍රාමික අධ්‍යාපන පරිපාලන සේවකයින්ගේ සංවිධානය | නො.865/11, අශෝකාරාමය මාවත , සුසිත පුර, මාලඹේ. | ප්‍රේමසිරි වැලිවිට මයා<br>දු.ක. 0777037834 |
| තරුණ සංවර්ධන වෘත්තීයවේදීන් සඳහා වූ සංවිධානය | නො.871, ෆෙරි පාර, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ. | ප්‍රියදර්ශනී ආරියරත්න මිය<br>දු.ක. 0775257096 0112 861921 |
| ප්ලෑන් ඉන්ටර්නැෂනල් | උද්‍යාන පාර, හැව්ලොක් ටවුන් | කමල් හේරත් මයා<br>දු.ක. 0773572751 |
| වීලුදු මානව සම්පත් සංවර්ධන ආයතනය | නො.03, ටොරින්ටන් මාවත , කොළඹ 07. | එස්. සත්ගුණරාජ් මයා<br>දු.ක. 0112506272 0777733817 |
| සංහිඳ ළමා නිවාසය | නො. 195-බී, ආටිගල පාර, වටරැක, පාදුක්ක. | රංජිත් විල්වල ආරච්චි මයා<br>දු.ක. 0113173082 |
| ජීවන ලංකා පදනම | 27/2/ජී, පොල්හේන වත්ත , වෑවල , පිලියන්දල. | එස්. උඩගෙදර මයා<br>දු.ක. 0779392646 |
| කලුතර දිස්ත්‍රික්කය | | |
| ආසියා ලංකා සමාජ සංවර්ධන එකමුතුව | නො.669, ගාලු පාර, වාද්දුව. | එස්.එන්.ඩබ්. හේවගේ මයා<br>දු.ක. 0710881873 0768210077 |
| ගම්පහ දිස්ත්‍රික්කය | | |
| ගැමි කාන්තා පදනම | නො. 279 11/2, පහල කරගහමුන, කඩවත. | ජේ. ශීලා වික්‍රමරත්න<br>දු.ක. 0114 942054 0777304059 |
| සමස්ත ලංකා ගුරු සංගමය | කැනඩා ලේකම් කාර්යාලය, නො. 40, මැදපාර, කොළඹ 15. | ඇන්ජලා විජේසිංහ මිය<br>දු.ක. 0718663202 |
| මධ්‍යම පළාත | | |
| මහනුවර දිස්ත්‍රික්කය | | |
| KERD පදනම | නො.90 සී, දොඩම්වල , මුරුතලාව. | චාල්ස් එලමල්දෙනිය මයා<br>දු.ක. 0777498969 0812410350 |
| ව්‍යාවසාය කාන්තා සංසදය | ලක්ෂ්මි රූපලාවන්‍ය මධ්‍යස්ථානය, අරඹේකඩේ, මහනුවර. | ලක්ෂමී මලල්ගොඩ මිය<br>දු.ක. 08124463626 0725430222 |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | | |
| නවයුගම් සමාජ සංවර්ධන සමිතිය | නො.136 2/1, දඹුල්ල පාර, හැටන්. | ඒ. පූර්දුසාමි මයා<br>දු.ක. 0512222761 0775110942 |
| ග්‍රාමීය වතුකර අධ්‍යාපන සංවර්ධන සංවිධානය (PREDO) | නො.16/3, ප්‍රිම්රෝස් පාර, මුල්ගම්පොල , මහනුවර. | මයිකල් ජෝකිම් මයා<br>දු.ක. 0772277424 |
| සමාජ සුභ සාධන සංවර්ධන එකමුතුව | ඔට්ටරි දෙමල විද්‍යාලය. දික්ඔය. | එම්. මතියලගන් මයා<br>දු.ක. 0513501229 0776817207 |
| HEART සංවර්ධන සංවිධානය | ගෝර්විල්ල ජනපදය පාර, මස්කෙලිය පාර, අප්කොට්. | එස්.පී. මෝහන් මයා<br>දු.ක. 0512235264 0776309096 |
| මාතලේ දිස්ත්‍රික්කය | | |
| සිතුවම පුහුණු අධ්‍යාපන හා සංවර්ධන සංවිධානය | නො.24/19, කච්චේරිය පාර මාතලේ | අයි.එම්.චන්දන බණ්ඩාර මයා<br>දු.ක. 0773730919 |
| ජනසරණ සමාජ සංවර්ධන සේවය | නො.08 2/1, කිරිගල්පොත්ත. පලාපත්වල මාතලේ. | ඇලන් ඔබේසේකර මයා<br>0662222459 0776577709 |
| වයඹ | | |
| කුරුණෑගල දිස්ත්‍රික්කය | | |
| කාන්තා සංවර්ධන පදනම | මැදගම, කනත්තේ වැව. | දයා ආරියවතී මිය<br>දු.ක. 0372293500 0776339309 |
| "ප්‍රතිභා" ළමා සංවර්ධන පදනම | ප්‍රජා මණ්ඩල සුමග මාවත. නාබැට , මැල්සිරිපුර. | සමන් ලීලාරත්න මයා<br>දු.ක. 0716003648 |
| ළමා හා කාන්තා සංවර්ධන සංවිධානය | හර්ෂ කැලුම්, තලගොඩපිටිය, ඉබ්බාගමුව. | ජී. දීපා හෙට්ටිආරච්චි මිය<br>දු.ක. 0372259046 0718479864 |
| ළමා හා තරුණ සංවර්ධන පදනම | නො.120, විල්පොත , හලාවත. | මංගල ලාල් සත්කුමාර මයා<br>දු.ක. 0772695843 |
| වයඹ ගොවි කාන්තා සංගමය | දොරබාවිල , තුත්තිරිපිටිගම. | එච්.එම්.ජී බණ්ඩාර මයා<br>දු.ක. 0717020429 |
| පුත්තලම දිස්ත්‍රික්කය | | |
| "මිහිකත" පාරිසරික සංවිධානය | නො.60, මාලිගාවත්ත , මහවැව. | ජයසීලි ගාල්ලගේ මිය<br>දු.ක. 0322253228 0718119508 |
| විනිවිද සංවිධානය | කීරියන් කල්ලිය, මුන්දලම. | කේ.ඩී. පීරිස් මයා<br>දු.ක. 0776169400 |
| සර්වෝදය ශ්‍රමදාන සංගමය | දිස්ත්‍රික් කාර්යාලය, මාරවිල. | දු.ක.0322254301 |
| සබරගමුව | | |
| රත්නපුර දිස්ත්‍රික්කය | | |
| පරිසර හා ප්‍රජා සංවර්ධන තොරතුරු කේන්ද්‍ය | නො.96 2/1, බණ්ඩාරනායක මාවත, රත්නපුර. | චමින්ද පියසේකර මයා<br>දු.ක. 0452223135 0714122052 |
| පරිසර හා ළමා අයිතීන් සුරැකීමේ සංවිධානය | නො.235, පළවන මහල , කොළඹ පාර, මෝරගල්ල , ඇහැලියගොඩ. | ඩබ්.ආර්. වික්‍රමසිංහ මයා<br>දු.ක. 0363364345 0715347080 |
| කෑගල්ල දිස්ත්‍රික්කය | | |
| දෙහිඕවිට ප්‍රජා සංවර්ධන පදනම | නො.08, දැරණියගල පාර, දෙහිඕවිට. | කේ. ඒ . ආර්. එන්. කස්තුරි මයා<br>දු. ක. 0773054910 |
| අසාඩ් පදනම | 84-ඒ-1, මොරගම්මන, අරණායක, කෑගල්ල. | එම්.එස්.එම් සාදික් මයා<br>දු.ක. 0352258606 0775282249 |
| උතුරු පළාත | | |
| යාපනය දිස්ත්‍රික්කය | | |
| අවිහිංසාවාදී සෘජු ක්‍රියාකාරී එකමුතුව | නො.29, නුවර පාර,කයිතන්ඩි, චාවාකච්චේරි, යාපනය. | වී. ශක්තිවේල් මයා<br>දු.ක. 0778435771 |

# ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ පළාත් සභාවල ක්‍රියාකාරිත්වය සහ පළාත් අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් සඳහා නියාමක මූල ධර්ම හෙවත් පළාත් අධ්‍යාපන ප්‍රතිපත්තිය.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය :-

ශ්‍රී ලංකාවේ පවතින්නේ එක ලියවිල්ලක් පෙරලා බලා දකගත හැකි ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් නොව, පැහැදිලි සම්ප්‍රදායික සහ ලේඛන ගත නිර්ණායක ඔස්සේ හඳුනාගත හැකි, තේරුම් ගත හැකි හරවත් ව්‍යවහාර වලින් පරිපූර්ණ සමස්තයක ප්‍රතිරූපයක් මෙන්ම අඛණ්ඩව පෝෂණය වෙමින් ලියලන ක්‍රියාවලියක් සහිත අධ්‍යාපන නිධානයකි. ජාතික අධ්‍යාපනය යනුවෙන් හඳුන්වා දීමට පදනම් කරගනු ලබන ලේඛන අතර ප්‍රමුඛතම මූලාශ්‍රය ලෙස පිළිගනු ලබන්නේ 1939 අධ්‍යාපන ආඥාපනත හා ඊට වරින්වර එකතු වූ සංශෝධන සහිත අණපනත් වේ. 1869 වර්ෂයේදී බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේදී ස්ථාපනය කරන ලද ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව රජයේ විධිමත් අධ්‍යාපන යාන්ත්‍රණය ලෙස නොයෙකුත් ප්‍රතිසංස්කරණ ලක්වෙමින් අද දක්වා විකාශය වෙමින් පවතී. මුලදී ආගමික සංවිධාන සහ ප්‍රජා සංවිධාන හා ව්‍යාපාරික ආයතන අධ්‍යාපනය ලබාදීම භාරගත් අතර ලන්දේසි සමයේ පටන් පාසල් කළමණාකාරක මණ්ඩල රජයෙන් පැවැත්වීම මගින් සියලු ඉගැන්වීම් නියාමනයට කටයුතු කිරීම සඳහා ඉගැන්වීමේ කොමිසම හා අනුබද්ධිත ක්‍රියාමාර්ග ඉංග්‍රිසි පාලනය විසින් ද ඉදිරියට ගෙන යන ලදී. සිංහල බෞද්ධ බහුතර ජනතාව දෙමළ, මුස්ලිම් ආදි වෙනත් ජන වර්ග ද ක්‍රිස්තියානි හා කතෝලික ආගමික මීසම ද අධ්‍යාපනයට බාහිරව සම්බන්ධ වූ අතර, පුරාණ බෞද්ධ විහාර මුල්කොට ගිහි පැවිදි දෙපාර්ශවයටම ශිල්ප ශාස්ත්‍ර සැපයීමේ පැරණි සම්ප්‍රදාය නිසා ශ්‍රී ලාංකික ජනතාව ඉගෙනීමට දක්ෂ වූ, ලැදි වූ ශිල්ප ශාස්ත්‍ර ප්‍රායෝගිකව ප්‍රගුණ කිරීමෙන් තමාගේත්, සමාජයේ ආර්ථික සාමාජික සංවර්ධනය ශිල්ප කලා මගින් පෝෂණය කරමින් ඉගෙනීමේ සමාජයක් බවට පත්වූහ. 1931 දී පටන් සමාජ සංවර්ධන ක්‍රියාවලියේ කැපී පෙනෙන පියවරක් වශයෙන් දේශපාලනික මැදිහත් වීමෙන් වැදගත් රාජ්‍ය තාන්ත්‍රික ප්‍රයෝගයක් ලෙස අධ්‍යාපනය තෝරා ගැනීම මගින් රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කැපවීම මත 1939 දී අධ්‍යාපන ආඥා පනත සම්මත කර ගැනීම විශාල පිම්මක් විය. විධිමත් ඉගැන්වීම් ක්‍රියාවලියක් පාසල් හා විශ්ව විද්‍යාලය මගින් කිසිදු භේදයකින් හෝ කොන් කිරීමෙන් තොරව සෑම දරුවකුටම නොමිලේ සැපයීම රජය මගින් තහවුරු කිරීම මෙම මුල් පියවරේදී පිළිගත් මූලධර්මය විය. එම ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා පහසුකම්, ස්ථාන, ආයතන, වැඩ සටහන්, ඉගැන්වීම්, පොත් පත්, පාඨමාලා සහ උපකරණ මෙන්ම ගුරුවරුන් සැපයීම ද අධීක්ෂණය සහ පරීක්ෂණ පැවැත්වීම ද ප්‍රධාන කාර්යයක් වූ හෙයින් එය සැපයීමටත් යාන්ත්‍රණයක් ඇති කිරීම නිසා අධ්‍යාපන අංශය විධිමත් පරිපාලන ව්‍යුහයක් තුළ රජයේ වැදගත් කාර්යාංශයක් යටතට පත්විය. ජාතික අධ්‍යාපන ක්‍රමය යනු සමස්ථයක් වශයෙන් මෙය ක්‍රියාත්මකවීමයි.

සිංහල බෞද්ධ බහුතර ජනතාව, දෙමළ, මුස්ලිම් ආදි වෙනත් ජන වර්ග ද ක්‍රිස්තියානි හා කතෝලික ආගමික මීසම ද අධ්‍යාපනයට බාහිරව සම්බන්ධ වූ අතර, පූර්ණ බෞද්ධ විහාර මුල්කොට ගිහි පැවිදි දෙපාර්ශවයම ශිල්ප ශාස්ත්‍ර සැපයීමේ පැරණි සම්ප්‍රදාය නිසා ශ්‍රී ලාංකික ජනතාව ඉගෙනීමට දක්ෂ වූ, ලැදි වූ ශිල්ප ශාස්ත්‍ර ප්‍රායෝගිකව ප්‍රගුණ කිරීමෙන් තමාගේත් සමාජයේ ආර්ථික සාමාජික සංවර්ධනය ශිල්ප කලා මගින් පෝෂණය කරමින් ඉගෙනීමේ සමාජයක් බවට පත්වූහ.

සාක්ෂරතාව, සහභාගීත්වය, ස්ත්‍රී-පුරුෂ සමානතාව, වැඩිහිටි සහ යාවජීව අධ්‍යාපනය, පූර්ව ළමාවිය සංවර්ධනය, භාෂා සහ ගණිත නිපුණතාව අනිවාර්ය විධිමත් අධ්‍යාපනය, අන්ත දුගී භාවය තුරන් කිරීම යනාදී සාර්ථකතා රාශියක් මැද පාඨමාලා විවිධාංගීකරණය, ඇගයීම් සහ පරීක්ෂණ පාසල් කළමනාකරණය, සිසු ගුරු අනුපාතය සහ උසස් මට්ටමේ ගුරුවරුන් හා අධ්‍යාපන කළමනාකරණ සේවා කණ්ඩායම් ඇති කිරීම සමගම ප්‍රාථමික, ද්විතීය සහ තෘතිය අධ්‍යාපන ආයතන හා ඒවායේ ඵලදායකත්වය ඉහළ මට්ටමකට ගෙන ඒමටද නිරතුරුවම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ප්‍රතිශෝධන මගින් යාවත්කාලීන කරනු ලැබූ විධිමත් සහ නොවිධිමත් අධ්‍යාපන ක්‍රමයක් මධ්‍යම රාජ්‍ය යාන්ත්‍රණය තුළින් වසර පනහකට වඩා පවත්වා ගෙන යමින් ප්‍රජාවට වඩා සමීපව සේවය සැපයීම පිණිස යාන්ත්‍රණය විමධ්‍යගත කිරීම ද ප්‍රගතිශීලි ලෙස ක්‍රියාත්මක විය.

## 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ පළාත් සභා පිහිටුවීම.

වෙනස් වන දේශපාලනික සහ සමාජ ආර්ථික ප්‍රවණතා සමගම සමාජයේ උද්ගත වූ ගැටලු වලට ප්‍රතිචාර වශයෙන් ද 1987 වර්ෂයේදී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මගින් රජයේ මධ්‍යම අධිකාරිය යටතේ මුළු දිවයිනටම සමානව ක්‍රියාත්මක වූ සියලු බලතල වලින් සුවිශේෂී වූ විෂය කීපයක් එම සංශෝධනයේ නව වැනි ලැයිස්තුව මගින් වෙන්කර පළාත් සභාවලට පැවරීමට කටයුතු කර තිබේ. එයින් එක් ප්‍රධාන විෂයක් වන්නේ සුවිශේෂිව එහි IIIවන උපලේඛනය මගින් විස්තර කර ඇති අධ්‍යාපන, අධ්‍යාපන සේවා සහ අධ්‍යාපන පහසුකම් සැපයීම- කළමනාකරණය සහ අධීක්ෂණය යන කරුණු ය. මෙම කරුණු තවදුරටත් එවර දේශපාලන පක්ෂ සම්මේලනයේ අප කමිටුවේ නිර්දේශය මත මාතෘකා 24 ක් ලෙස නිශ්චිතවම වර්ග කර ඇත. මීට අතිරේකව එම නවවැනි ලැයිස්තුව මගින් පළාත් සභාවලට පවරන ලද වෙනත් විෂයක් ලෙස සැලසුම්කරණය ගැන සඳහන් කරමින් පළාත් සභා ප්‍රදේශය තුළ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම ද පවරන බව සඳහන් කර තිබේ. පළාත් සභා පිහිටුවීමට පසුතලය වූ සමාජ තත්වය ගැන සැලකීමේදී දේශපාලන නිදහස ලැබීමට පෙර පටන්ම ශ්‍රී ලංකා සමාජයේ

මෝදු වෙමින් පැවති ගැටලු කීපයක් ප්‍රබල ලෙස බලපා තිබේ. ඒ අතර,

I. ජනවාර්ගික පදනම යටතේ සුළු ජන කොටස් ලෙස හඳුනාගෙන තිබූ කණ්ඩායම් වලට දේශපාලනයට තීන්දු ගැනීමේ බලය ඉල්ලීම.

II. අගනුවර පිහිටි ප්‍රධාන දේශපාලන සහ රාජ්‍ය ආයතන වලින් ගත්තා වූ ක්‍රියාමාර්ග පරිධිය දක්වා විහිදීමේදී පැන නගින බෙදාහැරීමේ යාන්ත්‍රණයෙහි ගැටලු.

III. අවිශ්වාසය, ප්‍රමාද, දුෂ්කරතා සමග දූෂණ සහ අක්‍රමිකතා වර්ධන වීම.

IV. ප්‍රාදේශීය අනන්‍යතාව, අවශ්‍යතා සහ ආරම්භකත්වය නොසලකා හැරීම.

V. කාලයක් සිට වර්ධනය වෙමින් තිබූ විවිධ සහ ප්‍රගතිශීලි දේශපාලන දර්ශන සහ මතවාද මෙන්ම කලමණාකරණය සහ පරිපාලනය පිළිබඳ ජනතා සහභාගීත්වය, විමධ්‍යගත කිරීම පහළින් ඉහළට මත විහිදුවන නව සැලසුම්කරණ ප්‍රතිපත්ති ආදී අදහස් වල පැතිරීම මෙන්ම,

VI. ප්‍රාදේශීය මට්ටමේ ඇති ස්වේච්ඡා සංවිධාන, ප්‍රජා කණ්ඩායම් සහ ජාත්‍යන්තර සම්මුති ආදියේ බලපෑම විශේෂයෙන් වැදගත්ය.

ඉහත කී ශ්‍රී ලංකා අධ්‍යාපනය ඉතිහාසයේ විකාශය සමගම විමධ්‍යගත කිරීමේ උච්චතම පියවරක් වූ පළාත් සභා ක්‍රමය යටතේ අධ්‍යාපන යාන්ත්‍රණය සකස් කරගැනීමේදී සැලකිය යුතු මූලික කරුණු වලින් ඉහළ ප්‍රමිතියක් සහිතව පළාත් මට්ටමේ මානව සහ සමාජ ආර්ථික සංවර්ධනයක් අනන්‍යතාවකින් පැවැත්වීම, පරිධියේ ජීවත්වන ජන කොටස් වල අභිමානයට සහ තෘප්තියට හේතුවේ.

**විශ්ව අධ්‍යාපන සම්මුති සහ ප්‍රතිපත්ති**

එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක හා සංස්කෘතික කාර්යභාර යුනෙස්කෝ සංවිධානය මගින් පවත්වන ලද අතිවිශාලතම ලෝක අධ්‍යාපන සම්මේලනය 1990 දී තායිලන්තයේ රොම්ටියන් නුවරදී පවත්වා සැමට අධ්‍යාපනය නම් වූ විශ්ව අධ්‍යාපන ප්‍රකාශනය ප්‍රකාශකොට දස අවුරුදු කාලයකට ඉලක්ක පිහිටුවා, එකඟ වන රාජ්‍ය එම ඉලක්ක කරා යාමේ ප්‍රගතිය අවුරුදු පහෙන් පහට විමර්ශනය කිරීම කරගෙන යනු ලැබේ. එම ආරම්භක වසරේදීම ශ්‍රී ලංකාව ද එම සැමටම අධ්‍යාපානය නම් වූ විශ්ව ප්‍රකාශයට අත්සන් තබා තම අධ්‍යාපන සැලසුම් එහි නිර්නායක වලට අනුරූප වන ආකාරයට සකස් කිරීම අරඹා තිබේ. අනතුරුව දේශීය යාන්ත්‍රණයක් ද සහිත කලාපීය සහ ලෝක ප්‍රගති සමාලෝචන වාර වලට ද සහභාගී වෙමින් සිය න්‍යාය පත්‍ර සකස් කරමින් තිබේ. ඒ අතරතුර එක්සත් ජාතීන්ගේ නියෝජිතයාතන ඇතුළුව අනෙකුත් නොයෙකුත් ආයතන වලින් එක් එක් තේමා යටතේ පවත්වනු ලබන සම්මන්ත්‍රණ ඇතුළු සම්මුති සහ සහයෝගිතා වැඩ සටහන් ඔස්සේ ද කැප වී තම අධ්‍යාපන උපාය මාර්ග යලි සැකසීමට ඉහළ ප්‍රගතියකින් දායකත්වය ලබා දීමේ මඟට පිවිස සිටී. ඒ අනුව සහස්‍ර සංවර්ධන ඉලක්ක කරා යොමු වීම ද අනතුරුව තිරසාර සංවර්ධන ඉලක්ක නිරතුරු නිශ්චිත ගමන්මග ලෙස උපයෝගී කරගනු පෙනේ. 2015 මැයි මස දකුණු කොරියාවේ ඉන්ෂියොන් හිදී පැවැත්වූ ලෝක අධ්‍යාපන සමුළුවේදී අවධාරණය කරන ලද 2015 න් ඔබ්බට සැමටම ගුණාත්මක, සාධාරණ සහ අන්තර්කරණ රාජ්‍ය අධ්‍යාපනයක් සහ ජීවිතය පුරාවට අධ්‍යාපන අවස්ථා සඳහා අයිතිය තහවුරු කිරීම ද තිරසාර සංවර්ධන අරමුණු අතර සිව්වැනි අරමුණ වන එකී ගුණාත්මක අධ්‍යාපනය තහවුරු කිරීමද අනතුරුව ඒ සඳහා ආසියානු සහ පැසිපික් කලාපයේ රාජ්‍යයන් සහ සිවිල් සංවිධාන වල ක්‍රියාකාරී සැලසුම් සාකච්ඡා කිරීමේ පසුහාර වැඩසටහන් ද ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර සංවිධාන වල ප්‍රමුඛතාව ලබා දෙන කාර්යයක් ලෙස ද පිළිගෙන තිබේ. මේ අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන සංවර්ධන සංධානය සිය සාමාජික සංවිධාන මගින් මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස ප්‍රජාවට සමීපතම ක්‍රියාකාරීන් ලෙස ඒවා ඇතුළුව වෙනත් සංවිධාන සහ පුද්ගලයින් ද පළාත් සභා මට්ටමේදී ඒකාබද්ධ කර පළාත් අධ්‍යාපන සැලසුම් සහ ප්‍රතිපත්ති සැකැසීමට උනන්දු කරනු ලැබේ. සුවිශේෂී සැලසුම් සඳහා නිර්නායක ලෙස සෑම පළාත් සභාවක්ම පළාත්බද අධ්‍යාපන ප්‍රතිපත්තියක් කරා යොමුවීම සුදුසුවන අතර මෙහිදී ජනතා සහභාගිත්වය ලබාගැනීම සඳහා සිවිල් සංවිධාන සමග එක්ව කටයුතු කළ යුතුය.

ඒ ඒ පළාත් සභාවක සකස් කළහැකි ඵලදායක ප්‍රතිපත්ති හා සැලසුම් පිළිබඳ විශේෂ ව්‍යාපෘතින් අධ්‍යාපන සංවර්ධන සංධානය මගින් සකස් කරදීමට ද සුදානමින් සිටී.

**P** වැලිවිට
**විශ්‍රාමික අධ්‍යාපන අධ්‍යක්ෂ,**
**විධිමත්, නොවිධිමත් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය සහ සමාජ අලෙවිකරණය**

## අධ්‍යාපනය පිළිබඳ වූ වියත් මත

- අධ්‍යාපනයේ ශ්‍රේෂ්ඨ පරමාර්ථය දැනුම නොව ක්‍රියාවය.
  - **හර්බට් ස්පෙන්සර්**
- සෑම පුද්ගලයෙකුම අධ්‍යාපන දෙකක් ලබති. ඉන් එකක් ඔහු අනුන්ගෙන් ලබන අධ්‍යාපනයි. අනෙක තමන්ගෙන්ම ලබන අධ්‍යාපනයයි.
  - **ගිබන්**
- නව ලොව විවෘත කල හැකි යතුර අධ්‍යාපනයයි.
  - **බර්ට්‍රම් රසල්සාමි**
- විනය ගරුක භාවයෙන් තොර උගත්කමින් වැඩක් නැත.
  - **වෙලින්ටන්**
- අධ්‍යාපනය සෞභාග්‍යයේ දී ආභරණයක් ද, හදිස්සියක දී ආරක්ෂාවක් ද වෙයි.
  - **ඇරිස්ටෝටල්**
- අධ්‍යාපනය හිස සහ අත පුහුණු කිරීම සඳහා පමණක් නොව හදවත පුහුණු කිරීම සඳහා ද විය යුතුය.
  - **මහත්මා ගාන්ධි**
- අධ්‍යාපනය, වර්ධනීය යාව ජීව ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.
  - **ජෝන් ඩුවී පඬිවරයා**
- විද්‍යා - දදති - විනයං - ඉගෙනීමෙන් විනය ඇති වේ.
  - **බුදුරජාණන් වහන්සේ**
- ප්‍රඥාවෙන් ගෙයක් ගොඩනගනු ලැබ ක්‍රමිකව එය ස්ථිර වේ. දැනගැන්මෙන් ද එහි කාමර සියළු ආකාර අනර්ඝ වූ ප්‍රසන්න වූ වස්තු වලින් පිරෙන්නේය.
  - **හිතෝපදේශ** - පි 876
- අධ්‍යාපනයේ කාර්යය වනුයේ හිස්වූ මතයක් වෙනුවට විවෘත මනසක් ප්‍රතිස්ථාපනය කිරීමයි.
  - **මැල්කම් ෆෝර්බ්ස්**

සකස් කලේ :- **K. D පීරිස්**

# ජාතික මට්ටමට යොමු කළ යුතු ඌව පළාතේ අධ්‍යාපන ප්‍රශ්න

පළමුව පැවසිය යුත්තේ ලංකාව පුරාම පළාත් මට්ටමින් මතුවෙන අධ්‍යාපන ප්‍රශ්න පොදුවේ සමානාත්වයක් උසුලන බවයි. නිදසුනක් ලෙස ප්‍රතිඵල හොඳ පාසල් වලට සම්පත් වැඩි වැඩියෙන් ලබා දිම ගත හැකියි. ඵලදායිතාවය ආයෝජනයට හේතුවක් වන අතර විෂමතාවයන් දුරු කිරීමට ආයෝජනය කරන ප්‍රතිපත්තියක් අධ්‍යාපන අමාත්‍යාංශයට නැත.

විභාග සමත්වීම පිළිබඳ තොරතුරු ඇතුළත් පහත දැක්වෙන සටහන බලන්න

| වර්ෂය | ශ්‍රේණිය | දිස්ත්‍රික්කය | ප්‍රතිශතය |
|---|---|---|---|
| 2011 | 5 වසර | ජාතික මටමට | 12% |
| 2011 | 5 වසර | බදුල්ල | 10% |
| 2011 | 11 වසර | ජාතික මට්ටම | 60.25 |
| 2011 | 11 වසර | බදුල්ල | 57.8 |
| 2011 | 13 වසර | ජාතික මටමට | 58.94 |
| 2011 | 13 වසර | බදුල්ල | 50.52 |

එකම විෂයක් වත් සමත් නැති පාසල් පිහිටා ඇත්තේ වියලුව, රිදීමාලියද්ද, හපුතලේ වැනි දුෂ්කර පළාත් වලය. සිසුන් 50 ට අඩු පාසැල් 112 ක් අතරින් 4ක් ඇත්තේ බදුල්ලේය. සාමාන්‍ය පෙළ අඩුම ප්‍රතිඵල වාර්තාවන්නේ බදුල්ල දිස්ත්‍රික්කයෙනි.

වතුකරය ලංකාවේ ආර්ථිකයට වැඩිම දායකත්වයක් සපයයි. නමුත් රටක් හැටියට අප ඊට පෙරළා කළ ගුණ දක්වන්නේ ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වතුකරයේ අධ්‍යාපනයට අඩුම ආයෝජනයක් එක්කරමිනි. පසුගිය වසර 200 ක ඉතිහාසය පුරාම දිළිඳුකම හා නූගත්කම වතුකරයේ දක්නට ඇත. එය අධ්‍යාපනයට බලපාන ප්‍රධාන සාධකයකි. රිදීමාලියද්ද වියලුව, පිටමාරුව ගම්මානවලද මේ ලක්ෂණ දැකිය හැකිය.

බදුල්ල දිස්ත්‍රික්කය - පාසැල් හැරයාමේ ප්‍රතිශත දැක්වෙන පහත වගුව බලන්න

| | |
|---|---|
| ශ්‍රේණිය 1 සිට 5 දක්වා | 40% |
| 11 වසර | 80% |
| 13 වසර | 20% |

පාසැල් හැර යන සිසුන් ප්‍රමාණය ඉහළයාම අඩුකර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශයට තිරසාර ප්‍රතිපත්තියක් නැත. ඒ වෙනුවට කරන්නේ වැඩි වැඩියෙන් සිසුන් වෙහෙස කරමින් සමත් වීමට නොහැකි විභාග සඳහා තල්ලු කිරීමකි. වෘත්තීය පුහුණු ලබාදී ඔවුන් ශ්‍රම බලකායට එක්කර ගන්නේ නැත. මේ නිසා ඔවුන් ඉදිකිරීම් කර්මාන්තයේ අත්වැඩ කරුවන් බවට පත්වෙති. ත්‍රීරෝද රථ මිලදී ගෙන ෆිනෑන්ස් සමාගම් වල ගොදුරු බවට පත්වෙති. අවසානයේ මේ නිසා බරපතල සමාජ හා ආර්ථික ප්‍රශ්න ගොඩනැගේ.

> ඉංග්‍රීසි බසින් ඉගැන්වීම පොදු ප්‍රතිපත්තියක් නොවන තාක් කල් සිසුන්ට අනාගත ලෝකය ජය ගත නොහැකි බවද ලියා තැබිය යුතුය

බදුල්ලෙන් විශ්ව විද්‍යාලයට ඇතුල් වීමට සුදුසුකම් ලබන්නේ 1.6%කි.

ගුරු පත්වීම් ලබා දීම ගැනද කතා කළ යුතුය. ගුරු පුහුණුවක් නොමැති විද්‍යා ගණිත ගුරුවරුන් ගමට හෝ වතුකරයේ සේවයට යොදවයි. අත්දැකීම් බහුල ප්‍රතිපල පෙන්වන ගුරුවරුන් නගරයේ තබා ගනිති. තොරතුරු තාක්ෂණය සඳහා ගමේ ගුරුවරුන් නැත, උපකරණත් නැත.

වතුකරයේ විද්‍යා ගණිත ගුරුවරුන් අවශ්‍ය ප්‍රමාණයට ඇත්තේම නැත. දමිළ ගුරුවරුන් වැඩිකර ගැනීමටද වැඩ පිළිවෙලක් නැත. ගොඩනැගිලි හා උපකරණ සඳහා විශාල මුදලක් වෙන් කළද අවශ්‍ය මානව සම්පත් සංවර්ධනයට ලබා දෙන්නේ අඩුම ප්‍රමුඛතාවයක් වීම ඛේදවාචකයකි. සමස්ත අධ්‍යාපනයම බරපතල ලෙස දේශපාලනීයකරණය වීම ශෝචනීය වේ. විදුහල්පතිවරු සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු බහුතරයක් ඒ සඳහා වූ සුදුසුකම් සපුරා නැත

මෙවැනි වාතාවරණයක් තුළ ගුණාත්මක අධ්‍යාපනයක් කෙසේ නම් සිසුන්ට ලැබේද?

සිංහල, දමිළ හා මුස්ලිම් සිසුන් ට එක වහලක් යට ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීමට ඌව පළාතේ ප්‍රථම ප්‍රධාන අමාත්‍ය පර්සි සමරවීර මහතා ආරම්භ කළ හාලිඇල විද්‍යා විද්‍යාලයත් ගන්නොරුව රණ බිම විද්‍යාලයත් ඉතා උසස් ප්‍රතිපල පෙන්වා ඇතත් එවැනි පාසැල් ගමේ හා වතුකරයේ සෑම නගරයකටම එකක් බැගින් හෝ ස්ථාපිත නොකරන්නේ ඇයි ද යන්න ප්‍රශ්නයකි.

ඉංග්‍රීසි බසින් ඉගැන්වීම පොදු ප්‍රතිපත්තියක් නොවන තාක් කල් සිසුන්ට අනාගත ලෝකය ජය ගත නොහැකි බවද ලියා තැබිය යුතුය.

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ (විශ්‍රාමික) වැඩ බලන සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සිරිල් වෙදගෙදර මහතා සමග කල සාකච්ඡාවක් ආශ්‍රයෙන් සකස්කරන ලද්දේ

**P A ප්‍රභාත් කුමාර විසිනි**

# නිදහස් අධ්‍යාපනය වචනයට පමණත් සීමාවූවක්ද?

අපේ රටේ ඇත්තෙන්ම මේ ක්‍රියාත්මක වන්නේ නිදහස් අධ්‍යාපනය ද? මෙය අද ජනතාව අතර සංවාදයට ලක්වී ඇති ප්‍රධාන මාතෘකාවක් බවට පත්වී ඇත. අධ්‍යාපනය වෙනුවෙන් ආයෝජනය කිරීම යනු අනාගතය වෙනුවෙන් කරනු ලබන ආයෝජනයක්, ඉතිරි කිරීමක් නම් එහි වටිනාකම් ප්‍රතිලාභ ලබාගැනීමට ආයෝජකයාට ඉඩක් තිබෙනවා ද?

රටේ පුරවැසියාගෙන් ලබාගන්නා බදු මුදලින් රජය අධ්‍යාපනයට යැයි පවසමින් විශාල ආයතන පද්ධතියක් මෙන්ම කාර්යය මණ්ඩලයක්ද නඩත්තු කරනු ලබයි. මහජන බදු මුදල් යම් කාර්යයකට වැයකරනවා නම් එයින් ලබන ප්‍රතිඵලය පිළිබඳව ජනතාවට දැනගැනීමට මෙන්ම එම මුදල් වැයකරමින් ලබන නිෂ්පාදන හෝ සේවාව පිළිබඳව විමසීමේ අයිතියක් ද පුද්ගලයාට තිබේ. රටේ අධ්‍යාපනය යන මග පිළිබඳව විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන විශ්වවිද්‍යාල ප්‍රජාව හැසිරෙන ආකාරයෙන් අවබෝධයක් ලැබේ. මේවායේ උපාධිධාරීන්ට රජයේ හැර වෙනත් ආයතනයක සේවය කිරීමට අපහසුබව ඔවුන් විසින් පෙන්වා දී ඇත.

පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබන සිසු ප්‍රජාවගේ අධ්‍යාපන අයිතිය බාරගනු ලබන්නේ රජයද? පුවත්පත් ආයතනද, එසේ නැත්නම් අපගේ අමතර පන්ති

පවත්වන පුද්ගලික ආයතන විසින් ද යන්න පිළිබඳ සැකයක් සමාජ ගතවී ඇත. මේ වන විට පළාත් සභාව, හා මධ්‍යම රජය අධ්‍යාපන ආයතන විශාල ප්‍රමාණයක් නඩත්තු කරමින් පවත්වා ගෙනගියත් වෙළඳසල් වල අළෙවිවන ප්‍රමිතියකින් තොර අධ්‍යාපනික පුවත්පත් මගින් අධ්‍යාපනික දැනුමක් ලබාදෙනු ඇතැයි යන මතය සමාජගත වි ඇත. විශාල මුදලක් වැයකරමින් අමතර පන්ති යැවීම මගින් අධ්‍යාපනය සාර්ථකව ලැබෙනවායැයි ජනමතයක් ගොඩනැගී ඇත. මෙම තත්වය අනුව අපේ රටේ නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මකවනවාද? අද අප රටේ අධ්‍යාපනික පුවත්පත් හිමියන් හා

> රටේ පුරවැසියාගෙන් ලබාගන්නා බදුමුදලින් රජය අධ්‍යාපනයට යැයි පවසමින් විශාල ආයතන පද්ධතියක් මෙන්ම කාර්යය මණ්ඩලයක්ද නඩත්තු කරනු ලබයි.

අමතර පන්ති විශාල ප්‍රමාණයක් බිහිවී ඇත්තේ පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය පිරිහී පවතින නිසාද යන්න ප්‍රශ්න කිරීමට පුරවැසියාට අයිතියක් නැත. මෙම පුද්ගලික පන්ති හා සගරා ප්‍රකාශන පවත්වාගෙන යන්නවුන් පිටුපස දේශපාලන බලවේගයන් ක්‍රියාත්මක වේ.

මානව සම්පත් හා භෞතික සම්පත් විශාල ප්‍රමාණයකින් සමන්විත අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය රජයේ වගකීමක් ලෙස කටයුතු කිරීමේ වගකීම පැහැර හැරීමට රජයට කිසිදු අයිතියක් නැත. එසේනම් ඒ පිළිබඳව පණිවිඩය සමාජ ගත කිරීමේ වගකීම C E D අපේක්ෂාවයි.

**වජිර උමගලිය**

# අ.පො.ස උ/පෙළ පාසල් අයදුම්කරුවන්ගෙන් 45% ක් සමාජයට එක් වන්නේ මෙහෙමයි.

"අධ්‍යාපනය" යන්න ලතින් භාෂාවෙන් බිඳී ආ වචනයකි. e-ducere, educo යන වචන වල ඇත්තේ පිටතට ඇද ගැනීම යන අර්ථයයි. අධ්‍යාපනයේ කාර්යභාර්ය වන්නේ ද සෑම පුද්ගලයෙකු තුළම ඇති විභව ශක්තීන් - සැඟවී ඇති හැකියාවන් ඉස්මතු කරලීමයි.

රටක සමස්ත සමාජ සංවර්ධනයේ සහ අධ්‍යාත්මික ගුණ වගාවේ තීරණාත්මක සාධකය වන්නේ අධ්‍යාපනය තුළින් පන්නරය ලබන්නා වූ ශිෂ්‍ය පරපුර නැමති මානව සම්පතය.

මෙම ශිෂ්‍ය පරපුර නැමැති මානව සම්පත වසර 12ක තම පාසල් අධ්‍යාපනයේ සාධන මට්ටම අ.පො.ස උ/පෙළ විභාගයට පෙනී සිටීම තුළින් හඳුනාගත යුතුය.

2012/2015 යන සිව් වසරක කාලය තුළ අ.පො.ස උ/පෙළ විභාගයට පාසල් තුළින් පෙනී සිටි අයදුම්කරුවන් පිළිබඳ සලකා බැලීම මෙම ලිපියේ මූලික අරමුණ වේ.

ඒ අනුව පාසල් පද්ධතිය තුළින් අ.පො.ස උ/පෙළ විභාගය සඳහා විශාල පිරිවැයක් දරා සුදානම් කරනු ලබන අයදුම්කරුවන්ගෙන් 45% කට ආසන්න ප්‍රමාණයක්, විභාගයට පෙනී නොසිටීම සියළු විෂයන් අසමත් වීම එක් විෂයක් හෝ දෙකක් පමණක් සමත් වීම යන කාණ්ඩයට අයත් වූ මානව සම්පතක් ලෙස පසුගිය වසර 04ක කාලය තුළ සමාජයට එක් වී ඇති බව පෙනීයයි.

එම නිසා වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු වගකිව යුත්තන්ගේ තියුණු අවධානය ඉහත කී ප්‍රතිඵල තුළින් විද්‍යාමාන වන සෝචනීය තත්වය කෙරෙහි යොමු කළ යුතුව ඇත.

**K. D පීරිස්**

**අ.පො.ස උ/පෙළ විභාගයට පාසල් අයදුම්කරුවන් ඉල්ලුම් කිරිම හා පෙනී සිටිම. 2012 - 2015**

| වසර | විභාගයට | | % | පෙනී නොසිටි සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|
| | ඉල්ලුම් කළ සංඛ්‍යාව | පෙනී සිටි සංඛ්‍යාව | | | |
| 2012 | 220076 | 196954 | 89.49 | 23122 | 10.51 |
| 2013 | 234266 | 209906 | 89.60 | 34360 | 10.40 |
| 2014 | 233223 | 207304 | 88.89 | 25919 | 11.11 |
| 2015 | 234872 | 210340 | 89.59 | 24540 | 10.41 |

**පාසල් අයදුම්කරුවන් අ.පො.ස උ/පෙළ විභාගයේදී**

සියලු විෂයන් අසමත් වීම.
සටහන 02

| වසර | % |
|---|---|
| 2012 | 7.68 |
| 2013 | 11.59 |
| 2014 | 8.01 |
| 2015 | 8.64 |

එක් විෂයක් පමණක් සමත් වීම.
සටහන 03

| වසර | % |
|---|---|
| 2012 | 11.13 |
| 2013 | 12.78 |
| 2014 | 12.33 |
| 2015 | 12.03 |

විෂයන් දෙකක් පමණක් සමත් වීම.
සටහන 04

| වසර | % |
|---|---|
| 2012 | 17.54 |
| 2013 | 17.07 |
| 2014 | 18.87 |
| 2015 | 17.54 |

විෂයන් තුනක් සමත් වීම
සටහන 05

| වසර | % |
|---|---|
| 2012 | 63.15 |
| 2013 | 58.56 |
| 2014 | 61.25 |
| 2015 | 62.35 |

A සාමාර්ථ තුනක් සහිතව
සටහන 06

| වසර | % |
|---|---|
| 2012 | 4.27 |
| 2013 | 2.22 |
| 2014 | 2.60 |
| 2015 | 2.83 |

විභාගයට පෙනී නොසිටීම, සියළු විෂයන් අසමත් වීම, එක් විෂයක් හා විෂයන් දෙකක් සමත් වීම
සටහන 07

| වසර | % |
|---|---|
| 2012 | 43.04 |
| 2013 | 45.53 |
| 2014 | 45.96 |
| 2015 | 44.67 |

# ගුණාත්මක අධ්‍යාපනය තුළින් යහපත් සමාජයක්

අධ්‍යාපනයේ පරමාර්ථය වන්නේ උගත්, යහපත් බුද්ධිමත් පුරවැසියන් බිහිකිරීමයි. ඒ තුළින් යහපත් සමාජයක් නිර්මාණය වේ. මිනිස් වර්ගයාගේ සංවර්ධනය ආරම්භවන්නේ එතැනිනි. මේ තත්වය මේ වන විට සමස්ත ලෝකයම පිළිගෙන ඇති බැවින් යුනෙස්කෝ වැනි ජාත්‍යන්තර ආයතන බිහිවී ඇත. එසේ වුවද විවිධ රටවල් අධ්‍යාපනය සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රම වල වෙනස්කම් ද නැතුවා නොවේ. ඒ එම රටවලට ආවේණික ගති පැවැතුම් සහ යටිතල පහසුකම් අනුවය.

තුන්වන ලෝකයේ දියුණුවන රටක් වශයෙන් අපගේ අධ්‍යාපනය ද සීග්‍රයෙන් ඉදිරියට යායුතුව ඇත. එහෙත් මෙරට තවමත් විධිමත් අධ්‍යාපනයක් වෙනුවට වරින්වර බලධාරීන්ගේ මතිමතාන්තර අනුව සකස් වන ක්‍රම ක්‍රියාත්මකවීම එතරම් සුභදායී නොවේ. තිරසාර සංවර්ධනයක් කරා යාමේදී අප විශ්වය සමග අත්වැල් බැඳගත යුතුය. ඒ සමගම අපගේ අනන්‍යතාවය ද අමතක නොකළ යුතුය.

මෙහිදී අපගේ අවධානය යොමුවන්නේ **ගුණ නැණ** යන පදයන් වෙතය. ඒ ඒවා අධ්‍යාපනය හා බැඳී ඇති බැවිනි. වසර දහස් ගණනක් ඈත අතීතයේ සිට වඩාත් වැදගත් වූයේ ගුණ වුවද මේ වන විට "ණැන" ද අත්‍යාවශ්‍යය. එහෙත් සිදුවෙමින් පවතින්නේ අපගේ අධ්‍යාපනය "ණැන" වෙනුවෙන් පමණක් සීමාවීමත් ගුණ නැත්තටම නැතිවීමත්ය.

> තුන්වන ලෝකයේ දියුණුවන රටක් වශයෙන් අපගේ අධ්‍යාපනයද සීග්‍රයෙන් ඉදිරියට යායුතුව ඇත. එහෙත් මෙරට තවමත් විධිමත් අධ්‍යාපනයක් වෙනුවට වරින්වර බලධාරීන්ගේ මතිමතාන්තර අනුව සකස්වන ක්‍රම ක්‍රියාත්මකවීම එතරම් සුභදායී නොවේ.

මේ තත්වය උදාවූයේ හැත්තෑව දශකයේ හඳුන්වාදෙන ලැබූ විෂයය මාලාව අප වැළැඳ ගත් ආකාරය නිසායි. සංවර්ධනය කරා යාමට විෂයය දැනුම අත්‍යාවශ්‍යය. විශේෂයෙන්ම විශ්වය සමග පෙරට යාමට එය මාර්ගයකි. එහෙත් එම මං පෙත යන සිසුවා මනුෂ්‍යත්වය හඳුනාගත යුතුය. ඒ සඳහා අවශ්‍ය මනසක් තිබිය යුතුය. එහෙත් වර්තමාන අපගේ අධ්‍යාපනය ආර්ථික සංවර්ධනය පමණක් අරමුණු කොටගෙන ඇත. ඒ අනුව "උගතමනා ශිල්පය මයි මතු රැකෙනා" වෙනුවට මතු රැකෙනා ශිල්පයමයි උගතමනා තත්වය හෙවත් ජීවත් වීම සඳහා අධ්‍යාපනය ලබන බවක් පෙනීයයි. ගුණ නැණ අංශ දෙකෙහි සමානත්වයක් සමබර බවක් නැත. සාරධර්ම හෙවත් මනුෂ්‍යත්වය පාසල් අධ්‍යාපනය තුළින් බැහැර වෙමින් පවතී. ඒ සඳහා වෙනනම විෂයයක් අවශ්‍ය යැයි අපි නොකියමු. අවශ්‍ය වන්නේ මනුෂ්‍යත්වය හඳුනාගන්නා කලාත්මක බවක් මනස තුළ ඇතිකිරීමය.

එදා සාහිත්‍ය පොතපත තුළින් පහළ ශ්‍රේණිවල සිටම ඒ මානසිකත්වය උචිත පරිදි ඉබේම සකස්වීම සිදුවිණි. සමාජ සාධාරණය මෙන්ම මානුෂීය මනසක් කලාව තුළින් බිහිවීම නියතය. ඒ රසඥතාවය නිසාය. එවන් මනසක් සමාජවිරෝධි ආකල්ප වලට යොමුවීම විරලය. එහෙත් විෂයය පමණක් හදාරා උගතකු වන පුද්ගලයා සාපරාධි ක්‍රියාවන්ට පෙළඹවීමට ඉඩ ඇත. ඒ සඳහා ඔහුගේ මනස බාධාවක් නොවේ. වෛද්‍ය විද්‍යාව වැනි විෂයයන් හැදෑරුවන් මිනීමැරීම් චෝදනාවන්ට පවා ලක්වන්නේ මේ නිසාය. ඉංජිනේරුවෙකු අදාළ විෂයය දැනුම අතින් පරතෙරට ගිය ද විවිධ උපක්‍රමයන් යොදාගෙන අපරාධ කිරීමට පෙළඹිය හැකිය. එවැනි සිදුවීම් සිදුවී ඇත. මේ නිසා ශිෂ්‍ය බවෙන් යුත් බුද්ධිමත් මනසක් ආරම්භයේදීම ඇතිකිරීමට රුකුලක් වන පරිදි සාහිත්‍ය විෂයයන් පාසල් අධ්‍යාපනයට එක්කළ යුතුව ඇත. මානව සංවර්ධනය සඳහා එය අත්‍යාවශ්‍යය.

තවද දේශීය මෙන්ම ජාත්‍යන්තර දැනුම් සම්භාරය ද අපගේ අධ්‍යාපනයට අත්‍යාවශ්‍යය. එපමණක් නොව සිවිල් සමාජය, දේශීය යටිතල පහසුකම් ආදිය පිළිබඳව ද අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතුව ඇත.

මේ සමගම තවත් විෂයය ක්ෂේත්‍රයක් පිළිබඳව විමසා බැලිය යුතුය. ඒ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයයි. සමහර රටවල පාසල තුළදීම ඒ ඒ සිසුන්ගේ වෘත්තීය කුශලතාවන් හඳුනාගැනීමත් ඒවා වැඩිදියුණු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීමත් සිදු කරනු ලබයි. මෙරට වෘත්තීය දක්ෂතා වෙන් කොට සැලකේ එමෙන්ම විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ අධ්‍යාපනය සඳහා ද විධිමත් ක්‍රමවේදයක් අවශ්‍යය.

මුල් ළමාවිය සංවර්ධනය ද විශේෂ අවධානය යොමු විය යුතු ක්ෂේත්‍රයකි කොතරම් සුවිශාලව අලංකාරව ශක්තිමත්ව යම් ගොඩනැගිල්ලක් සෑදුව ද එහි අත්තිවාරම ශක්තිමත් නොවේ නම් එම ගොඩනැගිල්ල ස්ථාවර නොවේ. මුල් ළමා විය අධ්‍යාපනය වැදගත් වන්නේ එබැවිනි. විශේෂයෙන්ම ළමයකුගේ මානසික සංවර්ධනයේ 80% සිදුවන්නනේ මුල් ළමාවියේදීය. ඵලදායී අධ්‍යාපනයක් සඳහා මනස පුරුදු වන්නේ එම අවදියේදී ය. එහෙත් මෙරට පවත්නා ළදරු පාසල් බොහොමයක් පවතින්නේ අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව නොවේ ඒ බැවින් ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අවශ්‍යය.

මේ කරුණු අවධානයට යොමු කරගනිමින් දේශයට ඔබින සමාජ හිතකාමී සාධරණ අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නේ නම් ජාති ආගම් වැනි සියලු භේදවලින් තොර සමාජ හිතකාමී මිහිමත පා තබා ජීවත් විය හැකි පුරවැසියකු බිහිවනු ඇත.

**J ශීලා වික්‍රමරත්න**

---

**5 වන පිටුවෙන්**

වෙනස්කම් වලට අනුකූලව අධ්‍යාපන පද්ධතියේ සිදුවන වෙනස්කම් හා එමගින් ඇතිවන බලපෑම සුළුවෙන් තැකිය නොහැකි වන අතර මෙය සමස්ත සමාජයේම සංවර්ධනය වෙනුවෙන් කෙටිකාලීන හා දිගුකාලීන අහිතකර බලපෑමක් ඇතිකරනු ලබයි. මෙම තත්වයන් වළකා ගැනීම සඳහා අධ්‍යාපනයේ සියලු අංශයන් හා පැතිකඩයන් ආවරණය වන පරිදි ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැකසීමේ හා ක්‍රියාවට නැංවීමේ දැඩි අවශ්‍යතාවයන් තිබේ. රටේ විවිධ ප්‍රදේශ වල පවත්නා අවශ්‍යතාවන් හා සම්පත් ඵලදායීව උපයෝජනය කරගත හැකි අදාළ පළාත්වල අධ්‍යාපනය සම්බන්ධයෙන් තීරණ ගැනීමට මෙහිදී පළාත් සභාවලට යම් ඉඩකඩ අවස්ථා ලබාදීම සම්බන්ධයෙන් ද සැලකිල්ල යොමුවිය යුතුවේ. අනාගත අභියෝගයන් සාර්ථකව ජයගැනීම සඳහා දැනුම හා නවෝත්පාදනය පාදක කරගත් අධ්‍යාපන ක්‍රමයක් තුළින් තිරසර සංවර්ධනය ශ්‍රී ලංකාවට ලඟාකරගත් හැක්කේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සිදුකරන්නාවූ මෙවැනි ධනාත්මක ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්යක් තුළින් පමණි.

# 2015 පශ්චාත් සංවර්ධන න්‍යායය පත්‍රය තිරසාර සංවර්ධන අරමුණු



එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මගපෙන්වීම සහ මැදිහත්වීම අනුව සහශ්‍ර සංවර්ධන අරමුණු (MDGs) හඳුන්වාදීම 2000 වසරේදී සිදුකරන ලදී. මූලික වශයෙන් අන්ත දරිද්‍රතාවය අවම කිරීම HIV ADS පැතිරීම වැළැක්වීම සහ සියලුම දෙනාට ප්‍රාථමික අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීම අතුළත්ව 2015 වසර වනවිට ගෝලීය වශයෙන් සපුරාගත යුතු අරමුණු 8 ක් මෙහි ඇතුළත්වී තිබිණි. http://www.un.org/millenniumgoals/ මෙම අරමුණු දිනාගැනීම තහවුරු කරගැනීම සඳහා වූ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් ලෝකයේ සියලුම රටවල් සහ ප්‍රමුඛපෙලේ සංවර්ධන නියෝජිතායන එකඟත්වයෙන් කටයුතු කළහ . මෙම සහශ්‍ර සංවර්ධන අරමුණු සපුරා ගැනීමට ලෝකයේ රටවල් සියල්ලක්ම සාමූහික වශයෙන් දරණ ලද ප්‍රයත්නයන් හේතුකොට ගෙන විශාල ප්‍රගතියක් අත්කරගැනීමට හැකිවී තිබේ. එක් එක් අරමුණ සම්බන්ධයෙන් ලබාගෙන ඇති ප්‍රගතිය සමාලෝචනය කිරීම 2015 වසරේදී සිදුකරණ ලදී. එහිදී අනාවරණය වූයේ ඉලක්කයන් තබාගැනීම ඵලදායී බවත් ජනතාවගේ ජීවිතවල සැබෑ වෙනසක් ඇතිකරලීමට සහශ්‍ර සංවර්ධන අරමුණු වලට හැකිවී තිබෙන නමුත් තවත් බොහොමයක් කාර්යයන් ඉටු කිරීමට තිබෙන බවයි. මෙම තත්වයන් සැලකිල්ලට ගනිමින් 2015 පශ්චාත් සංවර්ධන න්‍යායය පත්‍රය සැකසීමේ ක්‍රියාවලිය සාමාජිකත්වය දරණ රටවල් ප්‍රමුඛ කරගත් ප්‍රධාන කණ්ඩායම් සහ සිවිල් සමාජ සංවිධාන පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගිත්වයෙන් සිදුවිය.

**මීලඟට සිදුවන්නේ කුමක්ද?**

එක්සත් ජාතීන් ද 2015 පශ්චාත් සංවර්ධන න්‍යායය පත්‍රය සැකසීමේ සාකච්ඡාවන්හිදී පහසුකම් සලසන්නකුගේ කාර්යයභාරය ඉටුකළ අතර මේ සම්බන්ධයෙන් වන අධ්‍යයන හා “මාගේ ලෝකය සමීක්ෂණය” වැනි පුළුල් උපදේශන සමුළු මගින් එයට අවශ්‍ය සහාය ලබාදුන්නේය. මීට අමතරව සාමාජික රටවල් වලට විශ්ලේෂණාත්මක චින්තනය, සාක්ෂි පදනම් කරගත් භාවිතයන් පිළිබඳ අදහස් සහ ක්ෂේත්‍ර අත්දැකීම් බෙදාදීම මගින්ද සහාය දක්වන ලදී.

2015 සැප්තැම්බර් මාසයේද එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් නව තිරසාර සංවර්ධන න්‍යායය පත්‍රයේ කොටසක් වශයෙන් තිරසාර සංවර්ධන අරමුණු 17 ක් ලඟාකර ගැනීම (SDGs) පිළිගත් අතර ඒවා සෑම එකක්ම නියමිත පරිදි නිසි කාලරාමුවක් තුළදී අවසන් කළ යුතුවේ.

2030 වසර වන විට අන්ත දරිද්‍රතාවය අවසන් කිරීම සඳහා වූ ඉලක්කයන් 169 ක් තිරසාර සංවර්ධන අරමුණු වල අඩංගුවී තිබේ.

මෙම අරමුණු සහ ඉලක්ක මගින් මීලඟ අවුරුදු 15 තුළදී මානව වර්ගයා සහ අපගේ ලෝකය සම්බන්ධයෙන් වඩාත් වැදගත් තීරණාත්මක ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීම උත්තේජනය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. එම ප්‍රධාන ක්ෂේත්‍රයන් වන්නේ

**ජනතාව**

සියලුම ආකාරයේ සහ ස්වරූපයන්ගෙන් පවත්නා දරිද්‍රතාවය සහ සාගින්න නිමා කිරීමටත් සියලුම මානවයන්ට ඔවුන්ගේ ජීවන හැකියාවන් අභිමානවත් සහ සමානත්වයෙන් යුතු සෞඛ්‍යමත් වාතාවරණයකදී සපුරාගැනීමට හැකිවීම තහවුරු කිරීමට අපි අධිෂ්ඨානය කර සිටිමු.

**ලෝකය**

වර්තමාන සහ අනාගත පරම්පරාවන්හි අවශ්‍යතා සපුරාලීමට සහාය ලබාදීමට හැකි ආකාරයට තිරසාර පාරිභෝජනය සහ නිෂ්පාදනය ප්‍රවර්ධනය කරමින්, ලෝකයේ ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කරගැනීම සහ කාළගුණික වෙනස්කම් සම්බන්ධයෙන් වහාම පියවර ගනිමින් ලෝකය පරිහානියට පත්වීමෙන් ආරක්ෂා කිරීමට අපි අධිෂ්ඨාන කර ඇත්තෙමු.

**සෞභාග්‍ය**

සියලුම මනුෂ්‍යයන්ට සෞභාග්‍යමත් සහ පරිපූර්ණ ජීවිතයක් ගතකිරීමටත් ස්වභාව ධර්මය සමගින් මනා සංයෝගයෙන් යුතුව ආර්ථික, සමාජයීය සහ තාක්ෂණික ප්‍රගතිය ලබාගැනීම තහවුරු කිරීමට අපි අධිෂ්ඨාන කර ඇත්තෙමු

**සාමය**

භීතිය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර සාමකාමී සාධාරණ සහ සැමදෙනෙම අන්තර්ග්‍රහණයවූ සමාජයක් ඇතිකරලීමට අපි අධිෂ්ඨානය කර ඇත්තෙමු. **සාමයෙන් තොර තිරසාර සංවර්ධනයක් නොමැත, තිරසාර සංවර්ධනයකින් තොරව සාමයක් නොමැත.**

**පාර්ශවකරණය**

මෙම න්‍යායය පත්‍රය විශේෂයෙන්ම අන්තදුගී සහ වඩාත් අවදානමට පත්විය හැකි පුද්ගලයින්ගේ අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කරමින් සියලුම රටවල් වල සියලුම පාර්ශවකරුවන්ගේ සහ සියලුම ජනතාවගේ සහභාගිත්වයෙන් තිරසාර සංවර්ධනය සඳහා ජගත් පාර්ශවකරණයෙන් යුතුව ක්‍රියාවට නවනු ඇත ැංවීමට අපි තීරණය කළෙමු. සහශ්‍ර සංවර්ධන අරමුණු 17 ක් හඳුනාගෙන ඇති අතර මේවා පිළිබඳව සාරාංශගත තොරතුරු පහතින් දැක්වේ

1 අරමුණ - දරිද්‍රතාවය පිටුදැකීම_
*සියලුම ස්ථානයන්හි සියලුම ආකාරයෙන් පවත්නා දරිද්‍රතාවය අවසන් කිරීම*

**2 වන අරමුණ- කුසගින්න තුරන් කිරීම**
*කුසගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාවය ලබාගැනීම සහ පෝෂණය නංවාලීම සහ තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම*

**3 වන අරමුණ -යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම**
*සියලුම වයස් කාණ්ඩයන්ට අයත් සියලුදෙනා සඳහා සෞඛ්‍යමත් ජීවිතයක් සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම*

**4 වන අරමුණ- ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනය**
*සියලුදෙනාම අන්තර්ගතවූ සහ ගුණාත්මක වශයෙන් ඉහළ අධ්‍යාපනයක් සෑම අයෙකුටම ලබාදීමත් ජීවිතකාලය පුරාම අධ්‍යාපනය ලබාගැනීම ප්‍රවර්ධනය කිරීම තහවුරු කිරීම*

**5 වන අරමුණ- ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානත්වය**

*ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානත්වය සහ සියලුම කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබලගැන්වීම*

**6 වන අරමුණ -පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව**

*සියලුම දෙනාට ජලය සහ සනීපාරක්ෂාව ලබාගැනීමට හැකිවීම තහවුරු කිරීම*

**7 වන අරමුණ - සැමට ලබාගත හැකි සහ පිරිසිදු බලශක්තිය**

පහසුමිළට ලබාගත හැකි, විශ්වාසදායී, තිරසාර සහ නවීනතම බලශක්තිය සියලුදෙනාට ලබාදීම

**8 වන අරමුණ -අභිමානවත් වැඩ සහ ආර්ථික වර්ධනය**

*මෙම අරමුණ සියලුදෙනාම අන්තර්ග්‍රහණය වූ සහ තිරසාරවූ ආර්ථික වර්ධනයක් ර කියාවන් සහ අභිමානවත් වැඩ ප්‍රවර්ධනය කිරීම*

**9 වන අරමුණ - කර්මාන්ත නවෝත්පාදන සහ යටිතල පහසුකම්**

*ආපදා වලට ඔරොත්තුදෙන යටිතල පහසුකම්, තිරසාර කර්මාන්තකරණය සහ නවෝත්පාදනය දිරිගැන්වීම*

**10 වන අරමුණ - අසමානාවන් අවම කරලීම**

*රටවල් තුළ සහ රටවල් අතර පවත්නා අසමානතාවන් අවම කිරීම*

**11 වන අරමුණ - තිරසාර නගර සහ ප්‍රජාවන්**

*සියලු දෙනා අන්තර්ග්‍රහණය කරගත්, ආරක්ෂාකාරී, ආපදා වලට ඔරොත්තුදෙන සහ තිරසාර නගර බිහිකිරීම*

**12 වන අරමුණ - වගකීමෙන් යුතුව පාරිභෝජනය සහ නිෂ්පාදනය**

*තිරසාර පාරිභෝජනයක් සහ නිෂ්පාදන රටාවන් තහවුරු කීරීම*

**13 වන අරමුණ -කාලගුණය වෙනස්වීම සම්බන්ධ ක්‍රියාකාකරම්**

*කාලගුණ වෙනස්වීම සහ එමගින් ඇතිවන බලපෑම තුරන්කිරීමට කඩිනම් පියවර ගැනීම*

**14 වන අරමුණ -සාගර මුහුදු හා සමුද්‍රීය සම්පත්**

*සාගර, මුහුදු හා සමුද්‍රීය සම්පත් සංරක්ෂණය සහ තිරසාර අන්දමින් භාවිතා කිරීම*

**15 වන අරමුණ- ජීවත්වන පරිසරය**

*තිරසාර අන්දමට වනසම්පත කළමනාකරණය, කාන්තාරකරණයවීම වැළැක්වීම, භූමිය හානියට පත්වීම නැවැත්වීම සහ එම ක්‍රියාවලිය ආපසු යථාතත්වයට පත්කිරීම, ජීව විවිධත්වය අහිමිවීම නැවැත්වීම*

**16 වන අරමුණ -සාමය සහ සාධාරණත්වය**

*සාධාරණ සාමකාමී සහ සියලුදෙනා අන්තර්ග්‍රහණය වූ සමාජයන් ප්‍රවර්ධනය කිරීම*

**17 වන අරමුණ - අරමුණු දිනා ගැනීම සඳහා පාර්ශවකරණය**

*සංවර්ධනය සඳහා ජගත් පාර්ශවකරනය සජීවීකරණය කිරීම*

## අධ්‍යාපන සංවර්ධන සංධානය නව සාමාජිකයින් බඳවා ගැනීම

අධ්‍යාපන සංවර්ධන සංධානය තම සාමාජික සංවිධාන සංඛ්‍යාව ඉහළ නැංවීමට අපේක්ෂා කරනු ලබයි. අධ්‍යාපන සංවර්ධන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරීව සම්බන්ධවීමට රුචිකත්වයක් දක්වන සිවිල් සංවිධාන වලට/පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය. සාමාජිකක්වය ලබාගැනීම සඳහා පහත දැක්වෙන අවම සුදුසුකම් සපුරාලිය යුතුවේ

- අධ්‍යාපනය සම්බන්ධයෙන් **ස්වේච්ඡාවෙන්** වැඩකරන පළපුරුදු සංවිධානයක් හෝ පුද්ගලයෙක් විය යුතුය
- සංවිධානයක් නම් රජයේ අදාළ ආයතනයන්හි (දිස්ත්‍රික් ලේකම් /ප්‍රාදේශීය ලේකම්/සමාජ සේවා අමාත්‍යාංශය) ලියාපදිංචි වී තිබිය යුතුය

අධ්‍යාපන සංවර්ධන සංධානයේ සාමාජිකත්වය පිරිනැමීමේ අවසන් තීරණාත්මක බලය අධ්‍යක්ෂක මණ්ඩලය සතු බව කරුණාවෙන් සලකන්න. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර දුරකතන අංක 0112887642 ඔස්සේ අප අමතන්න නැත්කම් අපට ලියන්න අපගේ ලිපිනය

**අධ්‍යාපන සංවර්ධන සංධානය**
**අංක 439/6A**
**සුදර්ශන මාවත**
**නාවල පාර රාජගිරිය**

## අධ්‍යාපනය සම්බන්ධ ගැටලු සහ ඔබගේ යෝජනා වලට බලධාරීන්ගේ අවධානය යොමුකිරීමට අනගි අවස්ථාවක්

අධ්‍යාපන සංවර්ධන සංධානයේ හඬ ත්‍රෛමාසික සඟරාවේ පළකිරීම සඳහා ඔබගේ ප්‍රදේශයේ පවත්නා අධ්‍යාපනය සම්බන්ධ ගැටලු, අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තීන් වලදී අවධානය යොමු කළ යුතු කරුණු හා අධ්‍යාපන ප්‍රතිශෝධනයන්හි සැලකිල්ලට ගත යුතු කරුණු පිළිබඳ ඔබගේ යෝජනාවන් අපවෙත ලැබීමට සලස්වන්න.


**හඬ සඟරාව**
**උපදේශක මණ්ඩලය**

K. G පීරිස් මහතා
වජිර උමගලිය මහතා
සුභද්‍රා රාංසිංහ මහත්මිය
ලූර්දු සාමි මහතා

**සංස්කාරක සටහන**



මෙහි පළවන ලිපිවල අන්තර්ගත කරුණු වල දැක්වෙන අදහස් සහ මත එම ලිපිවල කතෘවරුන් පෞද්ගලික වශයෙන් දරණ ඒවාය. ඒවායේ අන්තර්ගත කරුණු සහ අදහස් අත්‍යාවශ්‍යයෙන්ම අධ්‍යාපන සංවර්ධන සංධානයේ අදහස් නොවන බව කරුණාවෙන් සලකන්න.

2016. 06, 25

# බිහිරිබාවය සහිතව ජීවත්වන පුද්ගලයන්ට අධ්‍යාපනයට ප්‍රවේශවීමට ඇති බාධා

අධ්‍යාපනය සියලුම දරුවන්ගේ අයිතියක් ලෙස වර්තමාන ලෝකය පිළිගෙන තිබේ. ලෝකයම පිළිගත් අන්තර්කරණ අධ්‍යාපන සංකල්පයේ අරුත වන්නේ දුබලතා හෝ ප්‍රබලතා නොසලකා සියලුම දරුවන්ට යෝග්‍ය අධ්‍යාපන පහසුකම් අවස්ථා ලබාදීමය. ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා විශේෂ ප්‍රවේශ මෙන්ම ක්‍රම වේද සකස් වී ඇත.විශේෂයෙන්ම ශ්‍රවණ ඌණතා සහිත දරුවන්ට ඵලදායී අධ්‍යාපනයක් ලබා දීමේදී සංඥා භාෂාව පිළිබඳ දැනුම ගුරුවරුන්, දෙමාපියන් හා ඊට අදාල වෙනත් වෘත්තිකයන් සතු වීම ඉතා වැදගත් වෙයි.

ශ්‍රී ලංකාව තුල ජීවත්වන මිලියන 22 පමණ වූ ජනගහණයෙන් 1.7 පමණ විවිධ අබාධතත්වයන් සහිතව ජීවත්වෙති . ශ්‍රවණාබාධිත , දෘෂ්‍යාබාධිත, සංචලන අබාධ සහිත සහ මානසික සෞඛ්‍යය ආබාධ තත්වයන් මෙම විවිධ අබාධ ගණයට අයත්වෙයි. භාෂණයේ වර්ධනයට , මානසික වර්ධනයට සහ සන්නිවේදනය තුලින් සමාජ අන්තර් ක්‍රියාවන් ගොඩනැගීමට ශ්‍රවණය උපකාරී වෙයි. වර්ෂ 2001 ජන සංගණනයට අනුව උතුරු නැගෙනහිර පළාත් රහිතව ශ්‍රී ලංකාව තුල ශ්‍රවණාබාධිතව ජීවත්වන පුද්ගලයන් 73,841 පමණ ජීවත් වෙති. (http(//www. statistics.gov.lk). ශ්‍රී ලංකා බිහිරි වුවන්ගේ මධ්‍යම සම්මේලනයට අනුව ශ්‍රී ලංකාව තුල මේ වනවිට ලක්ෂ 3 පමණ පිරිසක් බිහිරි බාවය සමග ජීවත් වෙති. බිහිරි බව සමග ජීවත්වන පුද්ගලයන් මූලික වශයෙන් කොටස් දෙකක් හඳුනා ගත හැකිය.

1.අර්ධ බිහිරි
2.සම්පූර්ණ බිහිරි

වර්තමානය වන විට බිහිරි පුද්ගලයන් සඳහා වෙන් වූ මූලික පාසල් 26ක් මෙරට ස්ථාපිතව ඇත .උදාහරණයක් ලෙස දකුණු පළාත තුළ පාන්චාලිය අහංගම, මාතර වල්ගම, කොලොන්මාරුව තංගල්ල යන පාසල් ස්ථාපිතව ඇත.එසේ නමුත් රත්මලාන බිහිරි විද්‍යාලය මූලික කරගෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන අනෙකුත් සංවිධාන ක්‍රියාත්මක වන අතර ලංකාව තුල පවතින අනෙකුත් බිහිරි විද්‍යාල කෙරෙහි අවධානය ඉතා අඩු තත්වයේ පවතී. මන්ද යත් රත්මලාන බිහිරි විදුහල තුල ලංකාව තුල සිටින සියලුම බිහිරි ළමුන් අධ්‍යාපනය ලබන බවට උපකල්පනය කිරීමයි.

එම බිහිරි ළමුන් සඳහා වූ පාසල් අර්ධ රාජ්‍ය ක්‍රමයට පාලනය සිදුවන නිසාවෙන් පාසල තුල පරිපාලනය පිළිබඳ තීන්දු තීරණ විධායක කාරක සභාවක් මගින් ගනු ලබයි. නමුත් මෙම සභාව තුල බිහිරි පුද්ගලයන්ගේ නියෝජනයක් සාමාජිකයන් වශයෙන් නොමැති තරම්ය ඒ හේතුකොටගෙන බිහිරි පුද්ගලන් සතු අවශ්‍යතා නිසි ආකාරව එම සභාව තුලින් ග්‍රහණය කර නොගනී .

මීට අමතරව විශේෂ අවශ්‍යතා ළමුන් සඳහා සාමාන්‍ය පාසල් තුල විශේෂ අධ්‍යාපන සම්පත් ඒකක පිහිටුවා ඇත.උදාහරණයක් ලෙස ගාල්ල ප්‍රදේශයේ පාසල් තුල විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන (Special needs resource center) 17 ක් පිහිටුවා ඇත.

බිහිරි බව සහිතව ජීවත්වන ළමුන් අධ්‍යාපනය හැදෑරීමේදී මූලිකවම සංඥා භාෂාව යොදා ගනී.පාසල් තුල ඉගැන්වීම් කටයුතු සිදු කරන ගුරුවරුන් සංඥා භාෂාව නොදැනුවත්කම, අඩු අවබෝධය බිහිරි බව සමග ජීවත්වන ළමුන්ගේ අධ්‍යාපනය සහ අනෙකුත් සන්නිවේදනයට විශාල ගැටලුවක් වශයෙන් පවතී. තවද අවිධිමත් ක්‍රම,අවිධිමත් සංඥා භාෂා භාවිතයෙන් පාසල් විශේෂ අධ්‍යාපන සම්පත් ඒකක තුල බිහිරි ළමුන් සඳහා ඉගැන්වීම සිදුකරයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රදේශීයව වෙන් වූ සංඥා භාෂාවන් ගොඩනැගීමේ ගැටලුව ඇති වෙයි. මෙහි මූලික හේතුව වශයෙන් හඳුනා ගත හැක්කේ ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමාධාරීන් පාසල් තුල විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන වල බිහිරි ළමුන් සඳහා ඉගැන්වීම් කටයුතු සිදුකරනු ලබයි.ජාතික අධ්‍යාපන ආයතනය විසින් එම පාඨමාලාවේදී සංඥා භාෂාව විෂය ක්ෂේත්‍රය සඳහා ඉතා කෙටි කාලසීමාවක් ඉගැන්වීම සිදු කරයි. එය පාසල තුලදී බිහිරි බව සමග ජීවත්වන ළමුන් සඳහා ඉගැන්වීම සඳහා ප්‍රමාණවත් නොවේ ඒ හේතුකොටගෙන ශිෂ්‍යන්ට දැඩි අපහසුතාවයකට පත් වීමට සිදුවෙයි ජාතික අධ්‍යාපන ආයතනය තුල සංඥා භාෂාව පිළිබඳ වෙන් වූ ඩිප්ලෝමාවක් පවතී. නමුත් මෙම ඩිප්ලෝමාධාරී ගුරුවරුන් පාසල් තුල අඩු බවත් දැනට පාසල් තුල ඉගැන්වීම් කටයුතු කරන මෙම විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමාධාරීන් වෙනම නැවත සංඥා භාෂා ඩිප්ලෝමාව හැදෑරීම සිදු නොකරයි.එම නිසා පාසල් ශිෂ්‍යයන් දැඩි අපහසුතාවයකට පත්වෙයි.

සංඥා භාෂාව ජීවී භාෂාවක් වශයෙන් ක්‍රමයෙන් වර්ධනය වීම සිදුවෙයි. භාෂාව යාවත් කාලීන කිරීමේ වැඩසටහන් අවම මට්ටමින් ක්‍රියාත්මක වේ. විෂය කරුණු නිසි ලෙස සාධාරණව ඉගැන්වීම් කටයුතු කරන්නේද යන්න නැවත සොයාබලා පරික්ෂා කරන ක්‍රමවේදයක් නොමැත.

ජාතික අධ්‍යාපන ආයතනය මේ වන විට ප්‍රාථමික අංශය සඳහා සංඥා භාෂාව යොදා පෙළපොත් නිර්මාණය සිදු කරන අතර පාසල් විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන වල සාමාන්‍ය පෙළපොත් භාවිතා කරමින් ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබයි. පාසල් විශේෂ අධ්‍යාපන සම්පත් මධ්‍යස්ථාන වල ගුරුවරුන්ගේ සංඥා භාෂාව පිළිබඳ නොදැනුවත්කම හේතුවෙන් බිහිරි බව සමග ජීවත්වන ළමයා පාසල හැර යාම සහ බිහිරිවුවන් සඳහාම වූ පාසල් සොයා යාමට ද එය බලපා ඇත.

සා.පෙළ, උ .පෙළ සමත්ව විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා ලඟා වූ පිරිස බිහිරි ප්‍රජාව අතරින් ඉතාම සුළු ප්‍රතිශතයකි.එයට හේතු වශයෙන් සංඥා භාෂා සුදුසුකම් සහිත විෂය කරුණු ඉගැන්වීමට සමත් ගුරුවරුන් නොමැති විම හඳුනා ගත හැකිය.

විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන්ගේ වෘත්තිය පුහුණු අධ්‍යාපන ආයතන ලෙස ප්‍රධාන වශයෙන් ජාඇල සිදුව, වත්තේගම, අමුණු කුඹුර, තෙලැබ්බුයාය, කැටවල හා රාගම ස්ථාපිත කර ඇත නමුත් මොවුන්ට වෘත්තිය පුහුණු අධ්‍යාපනයෙන් පසු රැකියා සොයාගැනීමට ගැටලුව පවතී. පෞද්ගලික අංශය මේ සඳහා මදක් විවෘත වුවද වෘත්තීය පුහුණු අධ්‍යාපනයෙන් පසුව රාජ්‍ය අංශ තුලින් බිහිරි පුද්ගලයන් සඳහා දොරටු විවර වීම ඉතා අවම මට්මක පවතී. ආබාධිතයන් සඳහා වූ ජාතික ලේකම් කාර්යාලයක් පිහිටුවා තිබුන ද එමගින් බිගිරි බව සහිතව ජීවත්වන පුද්ගලයන්ගේ අභිවෘද්ධියට, සංඥා භාෂා පරිවර්තකයන්ගේ, ගුරුවරුන්ගේ අභිවෘධියට වන සේවාවන් නොමැති තරම්ය.

සියලු දෙනාම ඇතුලත් සියලු සියලු දෙනාටම යෝග්‍ය, ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම තහවුරු කිරීම සඳහා මෙවන් වූ ගැටලු හඳුනාගනිමින් එයට නිසි විසඳුම් සෙවීම හා ලබාදීම අප සැමගේ වගකීමකි.

**චින්තක චතුරනාත්**

# අධ්‍යාපන සංවර්ධන සංධානය 13 වන වාර්ෂික මහාසභා රැස්වීම පවත්වනු ලබයි



පීරිස් මහතා නව අධ්‍යක්ෂක මණ්ඩලය අමතමින්

අධ්‍යාපන සංවර්ධන සංධානය සියළු දෙනාටම ගුණාත්මක සහ සමාන අවස්ථා සහිත අධ්‍යාපනයක් ලබාදීම සහතික කිරීම සඳහා කැපවී ක්‍රියාකරන සිවිල් සමාජ සංවිධාන එකතුවකි. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවේ සියලුම පළාත් සහ දිස්ත්‍රික්ක නියෝජනය වන සිවිල් සංවිධාන 60 කින් සමන්විත අධ්‍යාපන සංවර්ධන සංධානය ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ උන්නතියට මෙන්ම ගෝලීය ඉලක්ක අනුව සහ දේශීය අවශ්‍යතා අනුව දියුණු කිරීමට දායකත්වය ලබාදෙමින් කටයුතු කරයි.

2004 වසරේදී පිහිටුවන ලද අධ්‍යාපන සංවර්ධන සංධානයේ 13 වන වාර්ෂික මහාසභා රැස්වීම මාර්තු මස 13 වැනිදා තලාහේන ප්‍රජා අධ්‍යාපන මධ්‍යස්ථානයේදී සාමාජික සංවිධාන 60 ක සහභාගිත්වයෙන් පැවැත්විණි. රැස්වීමේ වැඩකටයුතු ආරම්භ කරමින් උප සභාපති K. D පීරිස් මහතා විසින් සාමාජිකයින් පිළිගැනීමේ කථාව සිදුකළ අතර මෙහි ආරාධිත දේශනය පැවැත්වූයේ මූලික සහ වැඩිහිටි අධ්‍යාපනය පිළිබඳ ආසියා දකුණු සහ පැසිෆික් කලාපීය සම්මේලනයේ (ASPBAE) බර්නි ලව්ග්‍රෝ මහතා විසිනි.

මෙහිදී අදහස් දක්වමින් ඔහු අධ්‍යාපන සංවර්ධන සංධානය පසුගිය වසරේදී ලබාගෙන ඇති ප්‍රගතිය සම්බන්ධයෙන් මහත් සතුට පළ කළ අතර සංවිධානයක් වශයෙන් තම කාර්යයන් සිදුකරගෙන යාමේදී වගවීම සහ විනිවිද භාවය සුරැකීමේ වැදගත්කම අවධාරණය කළේය. එසේම ASPBAE සංවිධානයේ ශාඛා සංවිධාන උපදේශිකා සිසිලියා මහත්මිය හඳුන්වාදීමද මෙහිදී සිදුවිණි.

මින් අනතුරුව අධ්‍යාපන සංවර්ධන සංධානයේ ව්‍යවස්ථාවට අනුකූලව සමාජික සංවිධාන නව අධ්‍යක්ෂක මණ්ඩලය සඳහා තම පළාතේ නියෝජිතයින් නම් කරන ලදී. මෙහිදී තෝරාපත් කරගන්නා ලද අධ්‍යක්ෂක මණ්ඩලයේ සාමාජිකයින් අතරින් පත්කර ගන්නා ලද නිලධාරී මන්ඩලය පහත දැක්වේ. මෙම අධ්‍යක්ෂක මණ්ඩලයේ ධූර කාලසීමාව වසර දෙකකි.

**තෝරාපත් කරගන්නා ලද නව නිලධාරී මණ්ඩලය**

**සභාපති**
K . D පීරිස් මහතා

**ලේකම්**
W. වෙල්ලාල මහතා

**භාණ්ඩාගාරික**
චමින්ද පියසේකර මහතා

**උප සභාපතිනී**
සුභද්‍රා රාජසිංහ මහත්මිය

**උප ලේකම්**
ලූර්දුසාමි මහතා

**අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික**
ඇන්ජලා විජේසිංහ මහත්මිය

**අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික**
කමල් හේරත් මහතා

**අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික**
වජිර උමගලිය මහතා

**අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික**
ප්‍රේමසිරි වැලිවිට මහතා

**අධ්‍යක්ෂක මණ්ඩල සාමාජික**
මොහමඩ් උවයිස් මහතා



බර්නි ලව්ග්‍රෝ මහතා සභාව අමතමින්


**ලේකම් කාර්යාලය**
**No.439/6A සුදර්ශන මාවත නාවල පාර, රාජගිරිය**
**Web: Cedsrilanka.net**
**TEL: 0112887642**